# සටහන

2014 ජනවාරි - පෙබරවාරි


2 ඉන්දියාවේ සමාජ ආර්ථික තොරතුරු බිඳක්

3 ශ්‍රී ලංකාවේ සෞභාග්‍යය සඳහා චීනයෙන් උගත හැකි පාඩම්

9 ගෝලීය වියපත් වූවන්ගේ ජීවන තත්ත්ව මිනුම් දර්ශකය

16 ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම


21 අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2006 අප්‍රේල්




රු. 20/-


ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

041000671




# ඉන්දියාවේ
## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...

| | |
|---|---|
| භූමි ප්‍රමාණය | වර්ග කි.මී. 3 287 262 |
| ජනගහනය (2014 ඇස්තමේන්තු) | බිලියන 1.236 |
| ජනගහන වර්ධන වේගය (2014 ඇස්තමේන්තු) | 1.25% |
| ජන ඝනත්වය | වර්ග කි.මී. 379.5 |
| උපත් අනුපාතය (2014 ඇස්තමේන්තු)(ජනගහනය දහසකට) | 19.89 |
| මරණ අනුපාතය (2014 ඇස්තමේන්තු)(ජනගහනය දහසකට) | 7.35 |
| උපතේදී ආයු අපේක්ෂාව ( අවුරුදු) | 67.8 |
| දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)(2013) | එ.ජ. ඩොලර් ට්‍රිලියන 4. 99 |
| ඒක පුද්ගල ද.දේ.නි. (2013) | එ.ජ. ඩොලර් 4000 |
| මූර්ත ද.දේ.නි. යේ වර්ධන අනුපාතය (2013) | 3.2% |
| ද.දේ.නි. යේ ආංශික සංයුතිය (2013) | කෘෂිකර්මය 17.4% කර්මාන්ත 25.8% සේවා 56.9% |
| රාජ්‍ය ණය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස (2013) | 51.8 % |
| අයවැය අතිරික්තය (+) හිඟය (-) ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස (2013) | -5.7 % |
| උද්ධමනය ( CPI ) | 9.6% |
| විදේශ සංචිත (2013) | ඩොලර් බිලියන 295 |
| ශ්‍රමබලකාය (2013) | මිලියන 487.3 |
| සේවා වියුක්ති අනුපාතය (2013) | 8.8% |
| සාක්ෂරතාව | 62.8% |
| ප්‍රධාන අපනයන | ඛනිජ තෙල්, මැණික්, යන්ත්‍රෝපකරණ, යකඩ සහ වානේ, රසායන ද්‍රව්‍ය, වාහන, රෙදිපිළි |
| ප්‍රධාන අපනයන රටවල් | එක්සත් අරාබි එමීර් රාජ්‍යය, එක්සත් ජනපදය, චීනය සිංගප්පූරුව, හොංකොං |
| ප්‍රධාන ආනයන | බොරතෙල්, මැණික්, යන්ත්‍රෝපකරණ, පොහොර, යකඩ සහ වානේ, රසායන ද්‍රව්‍ය |
| ප්‍රධාන ආනයන රටවල් | චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සවුදි අරාබිය, ස්විට්සර්ලන්තය, එක්සත් ජනපදය |
| ඉන්දියානු රුපියල්/ ශ්‍රී ලංකා රුපියල් අනුපාතය | 2.1208 (2014.08.06) |

ඉන්දියාව දකුණු ආසියානු රටකි. භූමි ප්‍රමාණය අතින් ලොව සත්වන තැන එයට හිමිවෙයි. ජනගහනය අතින් ගත් කළ චීනයට පසුව වැඩිම ජනතාවක් වෙසෙන රට ඉන්දියාව යි. එමෙන් ම එය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සහිත රටවල් අතුරින් වැඩිම ජනගහනය සහිත රට යි. දකුණෙන් ඉන්දියන් සාගරයෙන් ද, නිරිත දෙසින් අරාබි මුහුදින් ද, ගිනිකොන දෙසින් බෙංගාල බොක්කෙන් ද එය මායිම් වේ. එමෙන් ම බටහිරින් පකිස්තානයෙන් ද, ඊසාන දෙසින් චීනය, නේපාලය සහ භූතානය යන රටවලින් ද, නැගෙනහිරින් බංගලාදේශයෙන් සහ බුරුමයෙන් ද මායිම් වී ඇත. ශ්‍රී ලංකාව සහ මාලදිවයින ද ඉන්දියාවෙහි අසල්වැසි රාජ්‍යයන් ය.

ඉන්දියාවෙහි ඇත්තේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයක් සහිත ෆෙඩරල් ව්‍යුහයක් සමූහාණ්ඩුවකි. එය ප්‍රාන්ත 29 කින් සහ මධ්‍ය පාලන ප්‍රදේශ 7 කින් සමන්විතය. ඉන්දියානු රජයේ ප්‍රධාන විධායක නිලධාරියා වන්නේ අගමැතිවරයා යි. 2014 මැයි මස බලයට පත් භාරතීය ජනතා පක්ෂයේ නරේන්ද්‍ර මෝදි මහතා ඉන්දියාවේ වත්මන් අගමැතිවරයා ය.



සටහන

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

33 වෙළුම 1-2 කලාපය 2014 ජනවාරි/පෙබරවාරි

ISSN 1391-3697

# ශ්‍රී ලංකාවේ සෞභාග්‍යය සඳහා චීනයෙන් උගත හැකි පාඩම්

**ආචාර්ය ඩබ්. එම්. හේමචන්ද්‍ර**
සහකාර අධිපති

ශ්‍රී ලංකාව ඉහළ ආර්ථික වර්ධනයක් අත්පත් කරගනිමින් ජනතාවගේ සමෘද්ධිය සඳහා වේගවත් සංවර්ධන ගමනක යෙදී සිටී. චීන ආර්ථිකය, ශ්‍රී ලංකාව හා සෘජුව සැසඳිය නොහැකි මුත් මේ දෙරට අතර සමානතා කිහිපයක් දැකිය හැකි ය. දෙරටේ ම ආර්ථික විවෘත ආර්ථික බවට පත්වූයේ 1978 දී ය. එමෙන් ම දෙරටේ ජනගහනයෙන් බහුතරයක් බෞද්ධයන් වන අතර ඔවුන්ට ම ආවේනික වූ භාෂා පවතී. පසුගිය කාලය තුළ දෙරට ආර්ථික විශාල කෘෂි අංශයක් සහිත ග්‍රාමීය ආර්ථිකවලින් ආර්ථික වර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් වන කාර්මික සහ සේවා අංශවලින් සමන්විත ආර්ථික බවට ඉතා සාර්ථක අන්දමින් පරිවර්තනය විය. තවද, චීනය සහ ශ්‍රී ලංකාව ආසියාතික රටවල් වන අතර 18 සහ 19 වන ශතකවල වේගයෙන් වර්ධනය වූ බටහිර රටවල් වලට (ඇමෙරිකාව සහ යුරෝපය) සාපේක්ෂව මෑත කාලීනව වේගවත් ආර්ථික වර්ධනයක් ළඟාකර ගනිමින් සිටී. කෙසේ වුව ද, වඩාත් සැලකිය යුතු වෙනස වනුයේ ශ්‍රී ලංකාව 2009 දක්වා දශක තුනක් තිස්සේ යුද්ධමය තත්ත්වයකට මැදිව සිටි රටක් වීමත් චීනය ජපානය අභිබවා යමින් ලෝකයේ විශාලතම ආර්ථිකය බවට පත්වීමට වේගවත් ආර්ථික ගමන් මාර්ගයක නිරත වී සිටීමත් ය. අද චීනය ලෝකයේ දෙවන විශාලතම ආර්ථිකය හිමි රට වන අතර සෞභාග්‍යය ළඟාකර ගැනීමෙහි නියුතු ශ්‍රී ලාංකිකයන් වන අපට චීනයෙන් උගත හැකි පාඩම් බොහෝ ය.

පසුගිය දශක තුනක කාලය තුළ චීනයේ ඓතිහාසික ද්විත්ව පරිවර්තනයක් එනම් ග්‍රාමීය කෘෂි සමාජයෙන් නාගරික හා කාර්මික සමාජයකට අවතීර්ණ වීම සහ පාලිත ආර්ථිකයකින් වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයකට පරිවර්තනය වීමත් යන සම්මිශ්‍රණය මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගෙන තිබේ. ඉහළ ආර්ථික වර්ධනයක් අත්පත් කර ගත්තා පමණක් නොව 2013 ලෝක බැංකු වාර්තාවට අනුව එහි දරිද්‍රතාවය සියයට 65 ට වඩා ඉහළ මට්ටමක සිට සියයට 10 ටත් අඩු මට්ටමකට ගෙන ඒමට චීනය සමත් විය. 1978 සිට ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සමාජ-ආර්ථික සහ සමාජ-දේශපාලන වෙනස්කම් පෙරදැරිකරගෙන ආකර්ෂණීය ප්‍රතිඵල අත්කරගෙන තිබේ. 2013 ලෝක බැංකු වාර්තාවට අනුව චීන ප්‍රතිසංස්කරණවල අන්තර්ගතය පහත සඳහන් පරිදි වේ.

- ප්‍රයෝජ්‍ය සහ සඵල වෙළෙඳපොළ ප්‍රමුඛ ප්‍රතිසංස්කරණ:

මෙමගින් දැඩි නියමු පර්යේෂණ කරා ප්‍රාදේශීය පරිපාලනය යොමු කිරීම දිරිමත් කරන ලදි. මෙම ප්‍රතිසංස්කරණවල එක් ප්‍රධාන ලක්ෂණයක් වූයේ ඔවුන්ගේ ද්වි-මාර්ගික ස්වාභාවය යි. එනම් පැරණි ප්‍රමුඛ අංශවල රජයට අයත් ආයතන දිරි ගැන්වීමත් සමඟ පෞද්ගලික ව්‍යාපාර පුළුල් වීමට සහ විවෘත භාවයට පත්කිරීමට ඉඩදීම යි.

- සමාජයීය සහ සාර්ව ආර්ථික ස්ථායීතාව සමඟ වූ තුලිත වර්ධනය:

ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මඟින් ආර්ථික වර්ධනය හදිසි ප්‍රමුඛත්වයක් ලෙස සලකන ලදි. වේගවත් ආර්ථික සහ ව්‍යුහාත්මක වෙනස්වීම් කාලය තුළ සමාජයීය ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා රජය මනා ලෙස සකස් කළ ෆිස්කල්, පරිපාලන සහ රැකියා ප්‍රතිපත්ති සම්මිශ්‍රණයක් යොදාගන්නා ලදි. සැලකිල්ලට ගත් කාලපරිච්ඡේදය තුළ දුප්පතුන්ගේ යහපත වෙනුවෙන් උද්ධමනය අවම මට්ටමක සාර්ථකව පවත්වා ගැනීමට බලධාරීන්ට හැකිවිය.

- අන්තර් - ප්‍රාදේශීය තරඟය:

තරඟකාරී අන්දමින් ආයෝජන ආකර්ෂණය කර ගැනීමටත් යටිතල පහසුකම් සංවර්ධනයටත් දේශීය ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීමටත් ප්‍රාදේශීය පරිපාලනය සඳහා චීනය ඉඩකඩ සැලසුවේ ය. ප්‍රාදේශීය පරිපාලනයේ සංවර්ධන අරමුණු කරා වේගයෙන් ළඟා වීම සඳහා අනුගමනය කරනු ලබන ෆිස්කල් ප්‍රතිසංස්කරණ, දිරි දීමනා සහ සම්පත් ලබාදීම මෙම ප්‍රතිපත්ති තුළ අන්තර්ගත ය. ප්‍රධාන ප්‍රතිසංස්කරණ වර්ධන ඉලක්ක, සෘජු විදේශීය ආයෝජන රැකීරක්ෂා සහ

සමාජයීය ස්ථායීතාව යන ප්‍රබල ආර්ථික ධාවක කටයුතුවල සාර්ථකව නියැලුණු නිලධාරීන්ට පාරිතෝෂික පිරිනැමීම් ද ඒ අතර විය.

- දේශීය වෙළෙඳපොළ ඒකාග්‍රතාව:

මෙම ක්‍රියාවලිය යටතේ තනි දේශීය වෙළෙඳපොළක් කරා යාමට එරෙහිව භාණ්ඩ, ශ්‍රමය හා ප්‍රාග්ධන සංචලතාවට තිබූ ප්‍රාදේශීය බාධක සියල්ල ඉවත් කරන ලදි. පුළුල් ලෙස ඒකාග්‍ර වූ දේශීය වෙළෙඳපොළකට ප්‍රවිෂ්ඨ වීමට ඉඩදීමෙන් ආයතනවලට ඒවායේ ආර්ථික පරිමාණුකූල වාසි ලබා ගැනීමට සහ ඉහළ ආදායම් මට්ටම්වලට ළඟාවීමට ඉඩකඩ සලසන ලදි.

- ලෝක ආර්ථිකය සමඟ වූ ස්ථිරසාර ඒකාග්‍රතාව :

චීන-ලෝක වෙළෙඳපොළ ඒකාග්‍රතාවයේ පුළුල් වීම පෙන්නුම් කෙරෙන විශේෂ ආර්ථික කලාප පිහිටුවීම සහ ලෝක වෙළෙඳ සංවිධානයට අවතීර්ණ වීම මේ යටතේ ප්‍රධාන වේ. මෙය ආයෝජන, දියුණු තාක්ෂණය හා කළමනාකාරිත්ව විශේෂඥතාව රට තුළට ගෙන්වා ගැනීමට මහත්සේ උපකාරී වූ අතර චීනයේ අභ්‍යන්තර ආර්ථික ප්‍රතිසංස්කරණවලට ජවයක් එක් කරමින් චීනයේ භාණ්ඩ හා සේවා සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ ප්‍රවේශයක් එක් කළේ ය.

1978 සිට හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්ති සමඟ ශ්‍රී ලංකා බලධාරීන් විසින් ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ද චීනය අනුගමනය කළ ප්‍රතිපත්තිවලට බොහෝ දුරට සමාන යැයි සැලකිය හැකි ය. ශ්‍රී ලංකා ආර්ථිකය නිර්බාධ ආර්ථිකයක් වීමත් සමඟ වෙළෙඳාම, ප්‍රවාහනය සහ අනෙකුත් උපයෝගී සේවා පිළිබඳ ආර්ථික කටයුතුවල වේගවත් දියුණුවක් පෙනෙන්නට විය. ලෝක ආර්ථිකය සමඟ වඩාත් ස්ථිරසාර අන්දමින් සේවා සැපයීමෙහි සම්බන්ධවීමට නවීන තාක්ෂණය වේගයෙන් යොදා ගන්නා ලදි. ආරම්භක විවෘත ආර්ථික පැකේජය තුළින් එවකට වූ පොලී අනුපාත, විනිමය අනුපාත ඇතුළු මිල තීරණය වීම කෙරෙහි තිබූ පාලනයන් හා සලාකයන් ඉවත් කරන ලදි. මේ සමඟ ආනයන-අපනයන හා දේශීය වෙළෙඳාම මත වූ රජයේ පාලන ලිහිල් කරන ලදි. 1977 නොවැම්බර් මස සිට ශ්‍රී ලංකා රුපියල පාවීමට ඉඩ හරින ලදි. ඊට පෙර තිබූ පාලන කාලයේ මෙන් නොව ආර්ථික කටයුතුවල දී පුද්ගලික අංශයේ සහභාගිත්වය පුළුල් හා දිරිමත් විය. විදේශීය ආයෝජන සඳහා අවස්ථා සලසන ලද අතර තම රට තුළ ආර්ථික කටයුතුවල යෙදීම දිරිගන්වන ලදි. ඉහළ ආර්ථික වර්ධන අනුපාත සහ ඉහළ පුද්ගලික ආදායම් තුළින් බැංකු සහ මූල්‍ය සේවා සඳහා පවතින ඉල්ලුම වැඩිවිය. මෙමගින් දියුණු තාක්ෂණයත් සමඟ උප වෙළෙඳපොළවල, මූල්‍ය ආයතනවල සහ මූල්‍ය සේවාවන්හි සංවර්ධනය වේගවත් විය.

ඒ අනුව 1978 සිට චීනය සහ ශ්‍රී ලංකාව යන රටවල් දෙක ම මෑත කාලීන ඉතිහාසයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට ලක්වී ඇත. එනිසා මෙම රටවල් දෙක ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඇගයීම හා එමගින් අත්කරගත් ප්‍රගතිය සමාලෝචනය කිරීමත් චීනයේ සාර්ථක ආර්ථික කථාන්තරය තුළින් ශ්‍රී ලංකාවට උගත හැකි පාඩම් මොනවාද යන්න විමසා බැලීමත් කාලෝචිත ය. ශ්‍රී ලංකාව හා සසඳන කල චීනය අත්කරගෙන ඇති ප්‍රගතිය ඉතා ඉහළ මට්ටමක පවතින බව මුලින් ම ප්‍රකාශ කළ යුතු ය. විශ්ලේෂකයින් පුරෝකථනය කර ඇති පරිදි චීනය 2026 දී ලෝකයේ විශාලතම ආර්ථිකය බවට පත්වනු ඇත. දැනටමත් ලෝකයේ ඉහළ ම බැංකු 10 න් 2 ක් චීනය සතු ය. Globe Fortune ලැයිස්තුගත සමාගම් 500 න් 61 ක් චීනය තුළ ක්‍රියාත්මක ය. ලෝකයේ දෙවෙනි විශාලතම අධිවේගී මාර්ග පද්ධතිය තිබෙන්නේ චීනයෙහි ය. ලෝකයේ දිගම මුහුදු පාලම් 3 සහ ලෝකයේ කාර්ය බහුලම වරායන් 10 න් 6 ක් ම පිහිටා ඇත්තේ චීනයේ ය. තවද ශ්‍රී ලංකාවට සාපේක්ෂව සෞඛ්‍යය, අධ්‍යාපනය, විද්‍යාව හා තාක්ෂණය අතින් චීනය සැලකිය යුතු අන්දමින් ඉහළ ප්‍රගතියක් අත්කරගෙන තිබෙන බව සඳහන් කළ යුතුය. චීනය සහ ශ්‍රී ලංකාව සැසඳීමේ දී සැලකිල්ලට ගතහැකි නිර්ණායක කිහිපයක් පහත සඳහන් වේ.

පහත වගුවෙන් පෙන්නුම් කෙරෙන තොරතුරුවලට අනුව සාර්ව ආර්ථික දර්ශක අතින් චීනය 2010 වන විට අත්කරගත් ප්‍රගතිය එම කාලය දක්වා ශ්‍රී ලංකාව අත්කරගත් ප්‍රගතිය ඉක්මවී ය. 1980-2009 කාලය තුළ ශ්‍රී ලංකාව කුරිරු යුද්ධයකට හසුවීම තුළ සාර්ව ආර්ථික දර්ශක වලින් අඩු කාර්ය සාධනයක් පෙන්නුම් කළ අතර එම කාලය තුළ චීනය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ ඵල නෙළමින් සිටියේය. 1978 දී චීනයේ පැවැති ඇ.එ.ජ. ඩොලර් 190 ඒක පුද්ගල ආදායමට සාපේක්ෂව ශ්‍රී ලංකාව ඇ.එ.ජ. ඩොලර් 250 ක් වූ ඉහළ ඒකපුද්ගල ආදායමක් අත්කරගෙන තිබුණි. කෙසේ වුවද 2010 ට වන විට ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම වූ ඇ.එ.ජ. ඩොලර් 2260 ට සාපේක්ෂව චීනයට ඇ.එ.ජ. ඩොලර් 4,230 ක් තරම් ඉහළ මට්ටමකට ළඟාවීමට හැකිවිය. 1978 ආර්ථික තොරතුරුවලට අනුව චීනය සතු සමුච්චිත විදේශ සංචිත සහ අපනයන වටිනාකම ශ්‍රී ලංකාව සතු විදේශ සංචිත හා අපනයන වටිනාකම ඉක්මවූව ද ඒක පුද්ගල විදේශ සංචිත හා අපනයන ප්‍රමාණය (ඇ.එ.ජ. ඩොලර්) සම්බන්ධව ශ්‍රී ලංකාව චීනයේ මට්ටම ඉක්මවී ය. 2010 දක්වා අත්කර ගත් ඉහළ ආර්ථික ප්‍රගතිය තුළින් චීනය ජාත්‍යන්තරයේ ආර්ථික යෝධයෙකු විය. චීනයට සිය ඉතිරි කිරීම හා ආයෝජන ඉතා ඉහළ මට්ටමින් වර්ධනය කර ගැනීමට හැකිවූ අතර ශ්‍රී ලංකා ඉතුරුම් හා ආයෝජන වර්ධන අනුපාතික පහසුවෙන් ඉක්මවීමට හැකිවිය. විවෘත ආර්ථික ප්‍රතිපත්ති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ තුළින් විදේශීය ආයෝජන ගෙන්වා ගැනීම වඩාත් පහසු විය. නාගරීකරණය, සේවා වියුක්තිය, අධ්‍යාපනය හා ණය වැනි ඇතැම් දර්ශක අතින් චීනය ශ්‍රී ලංකාවට වඩා ඉදිරියෙන් සිටින බව තහවුරු වේ.

| දර්ශකය | චීනය | | ශ්‍රී ලංකාව | |
|---|---|---|---|---|
| | 1978 | 2010 | 1978 | 2010 |
| ජනගහනය (මිලියන) | 956 | 1,338 | 14 | 21 |
| ආර්ථික වර්ධනය (%) | 7.6 (1979) | 10.3 | 6.3 (1979) | 8.0 |
| ඒක පුද්ගල ආදායම (එ.ජ. ඩොලර්) | 190 | 4,230 | 250 | 2,260 |
| නිල සංචිත (එ.ජ. ඩොලර් මිලියන) | 2,141 | 2,867,906 | 397 | 7,179 |
| ඒක පුද්ගල සංචිත (එ.ජ. ඩොලර්) | 2.2 | 2,143.4 | 28.4 | 342.7 |
| නිර්යාත වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | 9,785 | 1,815,605 | 845 | 8,626 |
| ඒක පුද්ගල නිර්යාත (එ.ජ. ඩොලර්) | 10.2 | 1,356.9 | 60.4 | 410.8 |
| ද.දේ. නිෂ්පාදිත සංයුතිය (%) | | | | |
| කෘෂිකර්මය | 28.2 | 10.0 | 30.5 | 12.8 |
| කර්මාන්ත | 47.9 | 46.6 | 27.2 | 29.4 |
| සේවා | 23.9 | 43.4 | 42.3 | 57.8 |
| ජාතික ආයෝජන අනුපාතිකය (%) | 35.0 (1980) | 48.2 | 20.0 | 27.6 |
| ජාතික ඉතුරුම් අනුපාතිකය (%) | 32.6 (1980) | 52.5 | 15.5 | 25.3 |
| විදේශීය සෘජු ආයෝජන (එ.ජ. ඩොලර් මිලියන) | 430 (1982) | 243,703 | 1.5 | 435.1 |
| සෘජු ආයෝජන ගලායෑම් (එ.ජ. ඩොලර් මිලියන) | ල.නො. | 474,477 | 3 (1980) | 43 |
| සේවා වියුක්තිය (%) | 4.9 (1980) | 4.1 | 14.8 | 4.9 |
| නාගරික ජනගහනය (%) | 19.4 (1980) | 49.2 | 18.8 | 15.0 |
| විශ්වවිද්‍යාල සංඛ්‍යාව | ල.නො. | 1,164 | 7 | 15 |
| ආදායම් අසමානතාව (ගිනි සංගුණකය) | 29 (1981) | 42 (2009) | 32.0 | 49.0 |
| රාජ්‍ය ණය අනුපාතිකය (%) | 1.0 (1984) | 33.5 | 72.5 | 81.9 |

චීනය අත්කර ගෙන සිටින වර්තමාන ප්‍රගතිය කරුණු කිහිපයක ප්‍රතිඵලයකි. වර්තමාන ලෝකයේ චීනය උච්චතම තත්ත්වයක් අත්කර ගෙන තිබීම, ආර්ථික හා දේශපාලන වශයෙන් නිවැරදි දැක්මක් සහිත කැපවූ නායකත්වයක් තිබීම, දශක 5 ක් තුළ එම දැක්ම සාක්ෂාත් කරගැනීමට කැපවූ ශ්‍රම බලකායක් සිටීම සමඟ මුසුවූ සමාජ-ආර්ථික හා සමාජ-දේශපාලන සාධකවල සුසංයෝගාත්මක ප්‍රතිඵලයකි. දැනට වේගවත් සංවර්ධන මාවතකට පිවිස සෞභාග්‍යය අපේක්ෂාවෙන් සිටින ශ්‍රී ලාංකිකයනට චීනය අත්කරගත් සාර්ව ආර්ථික ප්‍රතිඵල තුළින් උගත හැකි පාඩම් බොහෝ ය.

ආර්ථික සෞභාග්‍යය අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකාවට ඇති මාවත විවෘත ආර්ථික ප්‍රතිපත්තීන් ය. පුද්ගලික අංශයට වෙළෙඳපොළ යාන්ත්‍රණය මත ක්‍රියාකාරී වීමට ඉඩ සලසා දුන් විවෘත ආර්ථිකය ආර්ථික ප්‍රගතියට ධනාත්මක පියවරක් විය. කැමති ඕනෑම පාර්ශ්වයකට ආයෝජනයට හා ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහභාගි වීමට හැකිවිය. රාජ්‍ය අංශයේ ආයෝජන යටිතල පහසුකම් සංවර්ධනයටත්, පුද්ගලික අංශය ධනාත්මක ආකල්පයෙන් යුතුව ආර්ථික ක්‍රියාවලියෙහි නියුක්ත කරවීමටත්, ආර්ථිකයට නව නවත් විවෘත ප්‍රතිපත්ති හඳුන්වා දෙමින් ප්‍රතිපත්ති සම්පාදකයින් පෞද්ගලික අංශයේ සහයෝගය ඉහළින් අපේක්ෂා කරන බව පැහැදිළිව දක්නට ලැබේ. වත්මන් සංවර්ධනය උදෙසා පැවැති සම්ප්‍රදායික චින්තනයෙන් බැහැරවීමට හා නව ධනවාදී සංකල්ප පිළිගැනීමට චීනයටත් සිදුවිය. පශ්චාත් ප්‍රතිසංස්කරණ චීනයේ මේ දක්වා වූ සීඝ්‍ර වර්ධනයට 1949 චීන නායක මාඕ සේතුං ගේ ජාතිය ගොඩනැගීමේ වැයම ඉමහත් දායකත්වයක් ඉටුකළේය. ජාත්‍යන්තරකරණය සහ අධිරාජ්‍යවාදය පිළිබඳ නව චින්තනය පදනම් කරගෙන විප්ලවයෙන් ප්‍රතිසංස්කරණයට යොමුවන සංක්‍රාන්තියට අවශ්‍ය පදනම මාඕ සේතුං විසින් දෙන ලදි.

චීනයේ ඊළඟ නායක ඩෙං ෂියා පිං 1978 සිට හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ යටතේ ආර්ථිකය ව්‍යවහාරික අදහස් වලින් ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සහ විමුක්තිය කරා අත්හදා බැලීම් මාලාවක් මෙහෙයවී ය. එමඟින් චීනයේ ගොවි චින්තනය ආර්ථික වර්ධනය දිරිමත් කරවන ධනේෂ්වර ලාභය කරා යොමු කරවීය. වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයට ක්‍රියාත්මක වීමට ඉඩදෙමින් රජයේ අඥාන ප්‍රතිපත්තිවලින් මිදී සිටීම චීනයේ සීඝ්‍ර ආර්ථික නැගීමට හේතුවිය. එහි දේශීය වෙළෙඳපොළ මුලින් ම විසිරුනු චීන ජන සමූහයන් වෙත ද පසුව පෙරදිග ආසියාව සහ අවසානයේ චීන ප්‍රාග්ධනය ලෝකයේ සෑම වෙළෙඳපොළකට ම භාණ්ඩ හා සේවා සැපයීමට යුහුසුළු විය. ධනවාදය මෙම නැග්මේ පදනම විය. චීනයේ තත්ත්වය එසේ නම් ශ්‍රී ලංකාවට ද එය නුපුලුවන් වන්නේ කෙසේද?

ශ්‍රී ලංකා ආර්ථිකයේ පසුබෑස්ම විවෘත ආර්ථික ප්‍රතිපත්ති නොව 30 අවුරුදු යුද්ධය යි. මෙම කාලය තුළ ජනතා අභිවෘද්ධිය කරා යොමුකළ යුතුව තිබූ සම්පත් මන්දගාමී ආර්ථික වර්ධනයන් අත්කර ගනිමින් යුද්ධය වෙත යොමුකිරීමට සිදුවිය. එහෙත් චීනයේ ද ප්‍රජාතන්ත්‍රවාදයේ යම් යම් අඩුපාඩු නිසා උද්ගත වූ 'Tiananmen' අර්බුදය වැනි අවස්ථා ද නොමැති වූවා නොවේ. එහෙත් ඒවා ඉතා සාර්ථකව කෙටි කලකින් මැඩපවත්වා ගැනීමට චීනයට හැකිවිය.

චීනය නිර්බාධවාදී ප්‍රජාතන්ත්‍රවාදයකට පත් නොවන බවත් එවැනි තත්ත්වයකට යොමුවූයේ නම් චීන ආර්ථිකය කඩාවැටෙන බවත් Lew Kuan Yew (Allison and Blackwell, 2013) ගේ මතය යි. එනිසා චීනයේ ප්‍රගති මාවතට ස්වාධිපත්‍ය දේශපාලනයෙන් මනා තල්ලුවක් ලැබී ඇත. චීනයේ නායකයින් පත්වනුයේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියකින් නොවේ. එම පත් කිරීම කොමියුනිස්ට් පක්ෂ ප්‍රතිපත්ති මත තීරණය වේ. එක් පක්ෂයක් දිගු කලක් බලයේ සිටීමේ ප්‍රතිලාභ චීන ජනතාවට පමණක් නොව අසල්වැසි මැලේසියාව සහ සිංගප්පූරුව වැනි රටවල ප්‍රගතියට ද රුකුලක් වී ඇත. පාලක පක්ෂයේ නායකයන් විසින් මෙම දිගු කාලය තුළ රටෙහි ආර්ථික උද්ගාමනයට ස්ථිර පදනමක් ලබාදී ඇත. චීනය අත්පත් කරගෙන තිබෙන සියයට 9 ක් වූ අඛණ්ඩ වාර්ෂික ආර්ථික වර්ධනය අර්ධ වශයෙන් පාලක පක්ෂයේ දිගුකාලීන බලයේ සිටිමෙහි ප්‍රතිඵලයකි. එම නිසා ප්‍රජාතාන්ත්‍රික වශයෙන් පක්ෂ ප්‍රතිපත්ති සකස් කරනවාට වඩා සන්තතික ආර්ථික වර්ධනයක් වෙනුවෙන් කැපවුනු පාලක පක්ෂයක් දිගු කාලීනව ආර්ථිකය මෙහෙයවීමක් තුළින් තනි කාලසීමාවක් තුළ විස්තීර්ණ ආර්ථික කාර්ය සාධනයක් අත්කරගත හැකි බව පෙනේ. මෙය ශ්‍රී ලංකාවට ද අනුගමනය කිරීමට අසීරු මාවතක් නොවනු ඇත.

නිෂ්පාදන වැඩිදියුණු කිරීම් සඳහා පුළුල් වූ වෙළෙඳපොළක් අවශ්‍ය ය. චීනයට බිලියන 1.3 ක ජනගහනයකින් යුතු දේශීය වෙළෙඳපොළක් ඇත. එමගින් නිෂ්පාදන භාණ්ඩ හා සේවා සඳහා ස්ථිර වූ වෙළෙඳපොළක් ලබා දී ඇත. ළඟාවිය හැකි දේශීය වෙළෙඳපොළට අමතරව චීනය අපනයන සූක්ෂ්ම වර්ධන මාවතකට ද අවතීර්ණ වී ඇත. චීනය ලද එක් වාසිදායක තත්ත්වයක් වන්නේ ලෝක වෙළඳ සංවිධානයෙන් ලද ප්‍රතිලාභ චීන ආර්ථිකයේ ඉරිතැලීම්වලින් තොරවූ ආර්ථික සමෘද්ධිය ළඟාකරවීමට මහත් සේ හේතු කාරකවීම යි. අපනයන ප්‍රමුඛ ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති පෙරමුණු කරගත් චීනයට ලෝකයේ විශාලත ම අපනයනකරු වීමට, විශාලත ම විදේශ ණය හිමියා වීමට සහ ලොව වඩාත් වේගයෙන් දියුණුවන ප්‍රධාන ආර්ථිකය හිමි රට වීමට හැකිවිය. නුදුරේ දී ජපානය හා එක්සත් ජනපදය පවා අභිබවා යාමට තරම් චීන ආර්ථිකය ශක්තිමත් වී තිබේ. මෙම සංවර්ධනයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ පවතින්නේ මිලියන 21 ක් තරම් ජනගහනයකින් යුතු කුඩා දේශීය වෙළෙඳපොළකි. මෙය දේශීය නිෂ්පාදන ප්‍රසාරණයට පවතින බාධාවකි.

රටක් වර්ධනය වීමට නම් ජාත්‍යන්තර වෙළෙඳාමට ප්‍රවේශ වීමට ඉඩ ප්‍රස්ථා තිබිය යුතු ය. චීනය ලෝක වෙළෙඳ සංවිධානයට සම්බන්ධ වී ආර්ථිකය වර්ධනය කරගත් ආකාරය උදාහරණයක් ලෙස ගෙන ඉන්දියාව, පකිස්තානය හා චීනය වැනි විශාල රටවල් සමඟ එළඹෙන වෙළෙඳ ගිවිසුම් මඟින් ශ්‍රී ලංකාවට ද මහඟු වාසිදායක තත්ත්වයක් අත්කර ගත හැකි ය. අති නවීන තාක්ෂණය පෙරදැරි කොට නිපදවූ භාණ්ඩවල ගුණාත්මක බව හා තරඟකාරී මිල තත්ත්වය තිබිය යුතුය. ආයෝජන ප්‍රතිපත්ති තවදුරටත් ලිහිල් කරමින් ලෝකයේ බලසම්පන්න නිෂ්පාදන ආයතන වල සහයෝගය ලබා අති නවීන තාක්ෂණයෙන් යුතු භාණ්ඩ හා සේවා ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කිරීමට සූදානම් විය යුතු ය. නිෂ්පාදකයින් පමණක් නොව ආයෝජන සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන ප්‍රවාහයක් ආකර්ෂණය කර ගැනීමට ප්‍රතිපත්ති සැකසිය යුතු ය. චීනයේ ප්‍රගතියට අර්ධ වශයෙන් එතෙර වාසය කරන චීන ජාතිකයින් සිය රටට ආපසු ගෙන එන ලද ප්‍රාග්ධනය හා දැනුම බෙහෙවින් පිටුවහලක් විය. මෙය දේශීය අවශ්‍යතා සඳහා එතෙර සිටින ශ්‍රී ලාංකිකයින් ලබාදෙන සහයෝගයට බෙහෙවින් සමාන දෙයකි. වර්තමානයේ පවා මැදපෙරදිග රටවල වැඩකරන ශ්‍රී ලාංකිකයින් මෙරටට එවනු ලබන සම්ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ විදේශ මූල්‍ය ගැටලු ලිහිල් කිරීමට මහත් සේ උපකාරී වී ඇත. ශ්‍රී ලංකාවට අවශ්‍ය ආයෝජන ප්‍රමාණය කෙතෙක් ද, ඒවා ලබාගත හැකි ආකාරයන් කවරේදැයි තක්සේරු කොට ඒ අතර පරතරය විදේශීය සෘජු ආයෝජන මඟින් ආවරණය කළහැකි පරිදි සෘජු-ආර්ථික හා සමාජ දේශපාලන වටාපිටාවක්/පරිසරයක් නිර්මාණය කළ යුතුව ඇත. මේ සම්බන්ධයෙන් පවතින ආයතන රාමුව එනම් ආයෝජන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය උපයෝගී කරගත හැකිය.

ගෝලීය පරිසරය තුළින් චීනය අතිමහත් වාසි අත්පත් කරගත් අතර සිය විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් ට්‍රිලියන 3 දක්වා

වැඩිකර ගැනීමට සමත් විය. යුරෝපය සහ ඇමෙරිකාව ඇතුලු බටහිර ලෝකයේ වෙළෙඳපොළවල ණය හිමියන් බවට පත්වී ඇත්තේ චීනය යි. විදේශීය ණය ගැනීමෙන් මූල්‍යයන කෙරෙන ශ්‍රී ලංකා පිළිවෙතට හාත්පසින් ම වෙනස්ව චීනය සිය මූල්‍යනය සිදුකරනුයේ ඉතුරුම් වර්ධනය, නිර්යාත වර්ධනය හා විදේශීය සෘජු ආයෝජන මගින් ය. ශ්‍රී ලංකාවේ සියයට 25 ක් වූ ඉතුරුම් අනුපාතයට සාපේක්ෂව 2010 දී චීනයේ ජාතික ඉතුරුම් අනුපාතිකය සියයට 52 විය. මෙය චීනයේ ආර්ථික කටයුතුවල ආයෝජනයට මහත් පිටුවහලක් විය. 2010 දී සියයට 27.6 ක් වූ ශ්‍රී ලංකා ජාතික ආයෝජන අනුපාතයට සාපේක්ෂව චීන ජාතික ආයෝජන අනුපාතය එම කාලය තුළ සියයට 48.2 ක් තරම් ඉහළ අගයක් ගන්නා ලදි. චීනය අත්පත් කරගත් ආකාරයට ශ්‍රී ලංකා ආර්ථිකය වේගයෙන් වර්ධනය කර ගැනීමට නම් ඉතුරුම් වර්ධනය සහ සෘජු විදේශීය ආයෝජන දිරිගැන්වීම අත්‍යාවශ්‍ය සාධක වේ.

ආර්ථික සංවර්ධනයට චීන අධ්‍යාපන ක්‍රමය විසින් දැඩි ප්‍රගමණයක් එක් කරන ලදි. චීනය තෘතීය අධ්‍යයන කටයුතු සඳහා නියමු විදේශීය විශ්වවිද්‍යාල වෙත සිය සිසු සහභාගිත්වය වැඩි කිරීම සඳහා සැලසුම් සකස් කරමින් සිටී. 2030 වන විට චීනයේ උපාධිධරයින් සංඛ්‍යාව මිලියන 200 දක්වා ඉහළ දැමීමට අපේක්ෂිත ය. මෙය ඇ.එ.ජනපදයේ ශ්‍රම බලකායටත් වඩා වැඩි ය. 2010 වසර වන විට ලෝකයේ පළමු පෙළ විශ්වවිද්‍යාල 500 න් 22 ක් ම චීනයේ විය. 2003 දී චීනයේ තිබුනේ මෙම කාණ්ඩයේ විශ්වවිද්‍යාල 9 ක් පමණි. තවද ලෝකයේ පළමු පෙළ විශ්වවිද්‍යාල 200 න් 11 ක් ම දැනට චීනයේ පවතින බව සටහන් කළ යුතු ය. මානව සම්පත් සංවර්ධනය ආර්ථිකයක අවශ්‍යතා සමඟ සමගාමීව පැවතිය යුතු අතර අධ්‍යාපන ක්‍රමය ජාත්‍යන්තර තලයට නොගැලපෙන අන්දමින් පවතී නම් එය ආර්ථික සංවර්ධනයට යම් යම් බාධා ඇති කරනු ඇත. ආර්ථිකයේ වේගවත් ප්‍රගමනයට අවශ්‍ය තාක්ෂණික ඥානය රට තුළ පවතින අධ්‍යාපන ක්‍රමය තුළින් ලබාදීම ඉතා ම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ එක්ව ජාත්‍යන්තර ප්‍රමිතියට ගෙන ඒමේ අවශ්‍යතාවක් පවතී. එබැවින් විශ්වවිද්‍යාල පද්ධතිය ඇතුලු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණයට ලක් කළ යුතු ය.

වේගවත් සංවර්ධනයක් සඳහා නිෂ්පාදන කර්මාන්ත ප්‍රධාන දායකත්වයක් ලබා දෙයි. උදාහරණයක් ලෙස අද චීනයේ කාර්මික හැකියාව ඉහළ ආදායම් ලබන රටවලට සමාන බව දැක්විය හැක. ලෝක ඉල්ලුම මත චීනය නොයෙකුත් භාණ්ඩ හා සේවා සපයයි. ඉල්ලුම මත ජාත්‍යන්තර වෙළෙඳපොළට සපයන භාණ්ඩ හා සේවා නිෂ්පාදනයෙන් චීනය ඉමහත් වාසි අත්පත් කරගනිමින් සිටී. නිරන්තර වෙනසකට බඳුන් වන චීන නිෂ්පාදන අතර ඉලෙක්ට්‍රොනික් හා විදුලිභාණ්ඩ, සන්නිවේදන උපකරණ, දෘෂ්‍ය උපකරණ, මෘදුකාංග නිෂ්පාදන, ඖෂධ නිෂ්පාදන බෙහෙත් සහ රසායනික නිෂ්පාදන බොහෝ ප්‍රමාණයක් අඩංගුවේ. චීන සමාගම් බොහෝ ක්ෂේත්‍රවලට අදාළ තාක්ෂණ ඥානයෙන් අනූන ය. එම ක්ෂේත්‍ර අතර රථවාහන එකලස් කිරීම හා උපාංග නිෂ්පාදනය, ප්‍රකාශ වෝල්ටීය කෝෂ, ජීව ඖෂධ නිෂ්පාදනය, නැනෝ තාක්ෂණය, පියවි සෛල චිකිත්සාව, අධිබල බැටරි කෝෂ, අධිවේගී දුම්රිය සන්නිවේදන උපකරණ, සූර්ය බල ටර්බයින, තනි මගී ගුවන් යානා, බලගැන්වූ රොකට්, අභ්‍යවකාශ චන්ද්‍රිකා, අධිබල පරිගණක, නාවික බහාලුම්, අන්තර්ජාල සේවා, විදුලිබල ටර්බයින සහ වෙනත් බොහෝ භාණ්ඩ නිෂ්පාදනය වෙමින් පවතී. නව නිෂ්පාදන හඳුන්වා දෙන බොහෝ සමාගම් රජය සතු ය. ලෝක බුද්ධිමය දේපල සංවිධානය මගින් ප්‍රදානය කරන ලද පේටන්ට් බලපත්‍රවලින් බහුතරයක් චීන නේවාසිකයින් සතු වීම විශේෂත්වය කි. පේටන්ට් බලපත්‍ර සඳහා 1996 තිබූ 23,000 වූ ඉල්ලුම්පත් සංඛ්‍යාවට සාපේක්ෂව 2008 වන විට ඉල්ලුම්පත් සංඛ්‍යාව 290,000 දක්වා වැඩි වී තිබුණි. පුද්ගලික ආයතන විශාල සංඛ්‍යාවක් විද්‍යා හා තාක්ෂණ කටයුතු වල නියැලී සිටිති. 1986 එවැනි ආයතන 7000 ක් තිබූ අතර 2006 වනවිට එම ආයතන ගණන 150,000 දක්වා ඉහළ ගියේ ය. චීන නිෂ්පාදන පිරිවැය ඉතා අඩුය. එබැවින් පහසුවෙන් ලෝක වෙළෙඳපොළේ තරඟ කළ හැකි ය. සාපේක්ෂ වාසි අත්කර ගත හැකි ය. අපනයන්වලින් අඩකටත් වඩා නිෂ්පාදනය කරනුයේ විදේශිකයින් සතු ආයතනවලින් හෝ බද්ධ වෙළඳ සමාගම් හෝ මගිනි. අධි තාක්ෂණ අපනයනවලින් සියයට 85 කටත් වඩා වග කියනු ලබනුයේ විදේශීය ආයතන මගිනි. ශ්‍රී ලංකාවට සංවර්ධනය වීමට අවශ්‍ය නම් චීනයෙන් මෙම පාඩම් උගත යුතුය.

ශ්‍රී ලංකාවේ කාර්මික අංශය හා සේවා අංශය දිගු කාලයක් පුරා වර්ධනය වුව ද ශ්‍රී ලංකාවට ඒ සඳහා අවශ්‍ය විදේශ මූල්‍ය අවශ්‍යතාව තව ම සපුරා ගැනීමට හැකිවී නැත. ශ්‍රී ලංකාවේ දේශීය වෙළෙඳපොළ ඉතා පටු සහ සීමිත බැවින් ආර්ථික වර්ධනයක් කරා යන ගමනේ දී විදේශීය ඉල්ලුමට සරිලන භාණ්ඩ හා සේවා නිපදවීමට හැකි විය යුතු ය. මූලික භාණ්ඩ නිපදවීමට වඩා එකතුකළ වටිනාකම් සහිත නිෂ්පාදන අපනයනයෙහි නිරත විය යුතුය. මානව සම්පත් සහ යටිතල පහසුකම් සංවර්ධනය තුළින් අවශ්‍ය සහයෝගය ලැබිය යුතු ය. නවීන නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන්නේ මේ නිසා ය. යටිතල පහසුකම්වල සංවර්ධනය අධි තාක්ෂණ නිෂ්පාදන ක්‍රියාදාමයක් කරා යොමුවීම සඳහා අවශ්‍ය සාධකයක් වේ.

නිෂ්පාදන ක්‍රියාවලියේ වැඩිදියුණුව සහ මානව සම්පත් වැඩි දියුණු කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධනය (R & D) වෙනුවෙන් කළ යුතු ආයෝජන ද වැඩි විය යුතුය. චීනයේ බහු ජාතික සමාගම් මෙම ක්ෂේත්‍රයේ අවශ්‍ය ආයෝජනය කර ඇත. අනාගත සංවර්ධනය සඳහා අවශ්‍ය යැයි පිළිගෙන ඇති පංච-කේන්ද්‍රීය සංකල්පය මත වූ පර්යේෂණ හා සංවර්ධන වැඩිදියුණු කිරීම් සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු බව අවධාරණය කළ හැක.

අවශ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා රටේ මූල්‍ය හා රාජ්‍ය ප්‍රතිපත්තිවල සහයෝගය ලබාදිය යුතුය. මූල්‍ය ප්‍රතිසංස්කරණ හා මූල්‍ය ප්‍රතිපත්ති චීනය ඉතා පරීක්ෂාකාරී අන්දමින් මෙහෙය වූ අතර එමගින් ප්‍රාග්ධනය පිටතට ගලායාම් හා මූල්‍ය ප්‍රසාරණයෙන් උණුසුම් වූ ආර්ථිකයට හා අසල්වැසි රාජ්‍යයන්ට සිදුවිය හැකි හානිකර තත්ත්වයන් මනාව පාලනය කරන ලදි. ලාභදායී මුදල් හා අතිවිශාල වියදම් චීනයේ නිර්යාත සඳහා මග හෙලි කරන ලදි. ඒ අනුව මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රාග්ධනය පිටතට ඇදී යාමට නොව රට තුළට ගලා ඒමට උරදෙන ආකාරයට සැකසිය යුතුය. ආර්ථික වර්ධනයේ පියවර කරා ගමන් කරන විට ආර්ථිකයේ දේශීය සහ විදේශීය අභියෝග ජය ගැනීමට සුදුසු අවදානම් කළමනාකරණ ක්‍රම රට තුළ ස්ථාපිත වී තිබීම අත්‍යාවශ්‍ය වේ. පසුගිය දශක 5 ක කාලය තුළ චීනයට වාර්ෂිකව සියයට 9 ක් වූ සාමාන්‍ය ස්ථායී ආර්ථික වර්ධන තත්ත්වයක් පවත්වාගෙන යා හැකි වූ අතර මූල්‍ය අර්බුදකාරී තත්ත්වයේ පවතින වර්තමාන ලෝක ආර්ථික පරිසරය තුළ ඉදිරි දශක දෙකක කාලය තුළ බිලියන 1.3 වූ චීන ජනතාව මැදි ආදායම් මට්ටමේ සිට ඉහළ ආදායම් තත්ත්වයට ගෙන යාම චීනයට අභියෝගයක් වනු ඇත.

චීන ආර්ථික සැලසුම් චීන ආර්ථික ප්‍රගතිය කේන්ද්‍රීය කර සකසා ඇත. චීන සැලසුම් මධ්‍යගත කොමියුනිස්ට් ආර්ථිකවල ලාක්ෂණිකයන්ගේ සමෝධානික ස්වරූපයක් ගනී. 1953 - 57 සිට 2011 - 2015 දක්වා ක්‍රියාත්මක කළ පස් අවුරුදු සැලසුම් මාලාවක් මත චීන ආර්ථිකය ක්‍රියාත්මක වේ. සෝවියට් ක්‍රමයේ සැලසුම් කිරීම්වලින් සමාජවාදී වෙළෙඳපොළ ආර්ථික සැලසුම් වෙත අවතීරණය වීමත් පැහැදිලිව පෙනෙන්නට තිබෙන අතර චීනය එමගින් සාර්ථක ප්‍රතිඵල අත්කර ගෙන ඇත. මීට සමාන අන්දමින් ශ්‍රී ලංකා ආර්ථිකය ද සෞභාග්‍යය සොයා යන ගමනේ දී මැදි කාලීන ජාතික සැලසුම්වලින් ප්‍රතිලාභ අත්කර ගනු ඇත. ශ්‍රී ලංකාවට ආර්ථික සැලසුම් කිහිපයක් අතීතයේ තිබුණ ද ඉන් අත්කර ගත් ප්‍රතිලාභ බොහෝවිට ඉලක්ක තත්ත්වයට පිටුපසින් විය. කෙසේ වුව ද ඉන් අදහස් කරන්නේ සැලසුම්වල නුසුදුසු බව නොවේ. සැලසුම් ඉලක්ක කරා ගමන් කරන විට යම් මග පෙන්වීමක් තිබිය යුතු බවයි. ඉදිරි කාලය තුළ සැලසුම් වඩා සාර්ථක ප්‍රතිඵල අත්කර දෙනු ඇත.

මේ දක්වා වූ සියලුම පැහැදිලි කිරීම් චීන ආර්ථිකයෙන් උගත හැකි පාඩම් පිළිබඳ වූ නමුත් චීන ආර්ථිකයට ද ගැටලු නැත්තේ නොවේ. ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තිවල මෙන් එහිද බොහෝ අඩුලුහුඩුකම් ඇත. චීන ඒක පුද්ගල ආදායම ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායමට වඩා බෙහෙවින් ඉහළ මට්ටමක පවතී වර්තමාන ලෝක සංවර්ධනයෙහි නොපැහැදිලි බවක් දිස්වන්නට තිබුන ද චීනය අද ලෝකයේ ප්‍රධාන පෙළේ මූල්‍යකරුවා සහ ආයෝජකයා වී ඇත. පවතින ලෝක අර්බුදයෙන් චීනය වාසනාව ළඟාකර ගෙන ඇත. ශ්‍රී ලංකාවට ද එවැනි තත්ත්වයක් අත්කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව තිබේ. ඒ සඳහා ප්‍රතිඵල අත්පත් කර ගැනීමේ අධිෂ්ඨාන පූර්වකව ඒ සඳහා සුදුසු සමාජ-ආර්ථික සහ සමාජ-දේශපාලනික ප්‍රතිසංස්කරණ මනාව ඇති කළ යුතුය. ලෝකයේ ධනය හා බලය අතින් සෞභාග්‍යය ළඟාකර ගත් චීන ආර්ථික ගමන් මාර්ගය පිළිබඳව චීනයන් පාඩම් උගත හැකිය. 2013 Legatum සෞභාග්‍ය දර්ශකයට අනුව පෙළගස්වන ලද රටවල් 142 ක් අතුරින් චීනය 51 ස්ථානයට පැමිණ ඇති අතර ශ්‍රී ලංකාවට හිමිවී ඇත්තේ එහි 60 වන ස්ථානය යි. ඒක පුද්ගල ආදායම එ.ජ. ඩොලර් 65,639.8 ක් හිමිකර ගනිමින් නෝර්වේ රාජ්‍යය එහි පළමු ස්ථානය හිමිකර ගෙන ඇත. මීට සමගාමීව චීනයේ හා ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ආදායම) පිළිවෙලින් එ.ජ. ඩොලර් 9,233.0 සහ එ.ජ. ඩොලර් 6,247.2 කි. ඒ නිසා චීනය හා ශ්‍රී ලංකාව යන රටවල් දෙකට ම සිය පූර්ණ ජාතික සෞභාග්‍යය පරිමාණය ළඟාකර ගැනීම සඳහා තව බොහෝ දුරක් යා යුතුව ඇත. ගෝල්ඩ්මන් සැක් ආයතනය ගණන් බලා ඇති ආකාරයට 2000 - 2010 කාලය තුළ චීනයේ දළ දේශීය නිෂ්පාදිතය එ.ජ. ඩොලර් ට්‍රිලියන 4 ක් දක්වා වර්ධනය වී ඇති අතර මෙම පදනම යටතේ චීනයේ දළ දේශීය නිෂ්පාදිතය වර්ෂ 2001 ඉන්දියාවේ මෙන් 7 ගුණයකි, ඉතාලියේ මෙන් තුන් ගුණයකි, ප්‍රංශයේ මෙන් දෙගුණයක්ය. මේ අනුව සීඝ්‍ර ආර්ථික වර්ධනයක් සහිතව සිටින ශ්‍රී ලංකාවට සෞභාග්‍යය උදාකර ගැනීමට චීනයෙන් ලද හැකි පාඩම් බොහෝ ය.

**මෙම ලිපිය ආචාර්ය ඩබ්.එම්. හේමචන්ද්‍ර මහතා විසින් සපයන ලද Jan-Mar 2014 "News Survey" සඟරාවේ පළවූ —Lessons from China for our Prosperity" යන ලිපියෙන් සිංහල බසට පරිවර්තනය කරන ලද්දේ බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩී.එම්.එස්. දිසානායක මහතා විසිනි.**

# ගෝලීය වියපත් වූවන්ගේ ජීවන තත්ත්ව මිනුම් දර්ශකය


**උදේනි ලංසකාර,** සහකාර අධ්‍යක්ෂිකා, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව.

**හැඳින්වීම:-**

විසි එක්වැනි සියවස පෙර නොවූ විරූ ආකාරයේ ජන විකාශයක් සිදු වූ ශතවර්ෂයකි. එහි මූලිකාංගය ලෙස ජනගහනය වයස්ගතවීම දැක්විය හැකි ය. වයස්ගත ජනගහනය ලෙස අර්ථ දක්වන්නේ අවුරුදු 60 ට වැඩි ජනගහනය යි. එය 2050 වන විට බිලියන දෙකක් වෙමින් ලෝක ජනගහනයෙන් පහෙන් එකක් ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ. (රූප සටහන 1)

රූප සටහන 1

**2012, 2030 සහ 2050 දී වයස අවුරුදු 60 ට වැඩි ජනගහනය ලෝක ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස**




(මූලාශ්‍රය: *Global AgeWatch Index 2013 Insight Report)*

මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන, ලෝක වයස්ගත පුද්ගලයන්ගේ ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය සහ ශුභසාධනය මැන බැලීමේ අරමුණින් 2013 ඔක්තෝබර් මස පළමුවැනි දිනට යෙදුණු එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර වැඩිහිටි දිනයේ දී HelpAge ජාත්‍යන්තර සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල මගින් ප්‍රථමවරට " ගෝලීය වියපත් වූවන්ගේ ජීවන තත්ත්ව මිනුම් දර්ශකය" (Global AgeWatch Index) හඳුන්වා දෙන ලදී.

මෙම දර්ශකය මගින් වයස්ගත ජනතාවගේ ශුභසාධනය පිළිබඳව මැන බැලීමක් කෙරෙන නිසා එතුළින් තවදුරටත් වැඩිදියුණු කළ යුතු සහ අවධානය යොමු කළ යුතු අංශ හඳුනා ගැනීමට හැකි වී ඇත. ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සංසන්දනාත්මක දත්ත මත පදනම්ව මෙම දර්ශකය සකස් කර වැඩිදියුණු කර ඇත.

දර්ශකය සඳහා යොදාගෙන ඇති රටවල් සංඛ්‍යාව 91 කි. එම රටවල් ලොව වයස්ගත ජනගහනයෙන් සියයට 89 පමණ නියෝජනය කරයි. දර්ශකය ගොඩනැගීම සඳහා ලෝක බැංකුව, ජාත්‍යන්තර සෞඛ්‍ය සංවිධානය, එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජයීය සම්බන්ධතා දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානය, යුනෙස්කෝව සහ Galleup World Poll සංවිධානය යන ආයතනවලින් දත්ත ලබාගෙන ඇත.

**දර්ශකයේ අරමුණු**

- වයස්ගත ජනතාවගේ ශුභසාධනය මැන බැලීම සහ ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවයෙහි බහුමාන ස්වභාවය ග්‍රහණය කර ගැනීම.
- වයස්ගත ජනතාවගේ කාර්යසාධනය මැනීමට සහ අභිවෘද්ධිය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය විධික්‍රම සැපයීම.
- වයස්ගත ජනතාවගේ සාර්ථකත්වය සහ උපායමාර්ගික ප්‍රතිපත්තිවල අඩුලුහුඩුකම් ඉස්මතු කිරීම.
- වයස්ගත වූවන් පිළිබඳ අදාළ ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත සැපයීම.

**දර්ශකයෙහි ව්‍යුහය**

මෙම දර්ශකය සකස් කිරීම සඳහා ආදායම් සුරක්ෂිතතාව, සෞඛ්‍ය මට්ටම, අධ්‍යාපනය සහ සේවානියුක්තිය සහ ජීවත්වීම සඳහා අවැසි පරිසරය යන ප්‍රධාන ක්ෂේත්‍ර 4 යටතේ ගැනෙන දර්ශක 13 ක් යොදාගෙන ඇත.

රූප සටහන 1

**ගෝලීය වියපත් වූවන්ගේ ජීවන තත්ත්ව මිනුම් දර්ශකය**



**ක්ෂේත්‍ර**

| | | | |
|---|---|---|---|
| 1. ආදායම් සුරක්ෂිතතාව | 2. සෞඛ්‍ය මට්ටම | 3. සේවා නියුක්තිය සහ අධ්‍යාපනය | 4. ජීවත්වීමට ඇවැසි පරිසරය |

**දර්ශක**

| | | | |
|---|---|---|---|
| 1. විශ්‍රාම ආදායම් ආවරණය | 1. අවුරුදු 60 දී ආයු අපේක්ෂාව | 1. වියපත් ජනගහනයේ සේවා නියුක්තිය | 1. සමාජ සම්බන්ධතා |
| 2. වියපත් වියේදී දරිද්‍රතා වේගය | 2. අවුරුදු 60 දී සෞඛ්‍ය සම්පන්න ජීවිතයක අපේක්ෂාව | 2. වියපත් ජනගහනයේ අධ්‍යාපන තත්ත්වය | 2. ශාරීරික සුරක්ෂිතතාව |
| 3. වියපත් ජනගහනයේ සාපේක්ෂ සුබසාධනය | 3. මානසික සුවය | | 3. නිදහසේ ජීවත්විය හැකි වීම |
| 4. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය | | | 4. පොදු ප්‍රවාහනය සඳහා ප්‍රවේශවීමේ හැකියාව |

**ක්ෂේත්‍ර**

1. ආදායම් සුරක්ෂිතතාව

මෙයින් හැඟෙනුයේ ප්‍රමාණවත් ආදායමක් ලැබීමත් එය තමන්ට රිසි සේ යොදා ගැනීමට ඇති හැකියාවත් තුළින් වියපත් කල මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට ඇති හැකියාවයි.

2. සෞඛ්‍ය මට්ටම

වයස්ගත වීමේදී ශාරීරික දුබලතා මෙන් ම අසනීප සහ ආබාධිත තත්ත්වයට පත්වීමේ අවදානමක් පවතී. එබැවින් මෙම ක්ෂේත්‍රයට අයත් දර්ශක මඟින් වයස්ගත වූවන්ගේ ශාරීරික සහ මානසික සෞඛ්‍ය පිළිබඳ තොරතුරු දක්වනු ලබයි.

3. අධ්‍යාපනය සහ සේවානියුක්තිය

මෙම ක්ෂේත්‍රයට අයත් දර්ශක මගින් වයස්ගත වූවන්ගේ දක්ෂතා සහ ශක්‍යතා පිළිබඳ මනිනු ලබයි.

4. ජීවත්වීම සඳහා අවැසි පරිසරය

වයස්ගත පුද්ගලයන්ට නිදහසේ සහ ස්වාධීනව ජීවත් වීමට අවශ්‍ය පරිසරයක් තිබිය යුතු ය. මෙම ක්ෂේත්‍රය මගින් සමාජ සබඳතා, ශාරීරික සුරක්ෂිතතාව, සමාජයීය නිදහස සහ පොදු ප්‍රවාහනය සඳහා ප්‍රවේශ වීමේ හැකියාව මනිනු ලබයි.

ආදායම් සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය මට්ටම යන ක්ෂේත්‍ර මගින් වයස්ගත පුද්ගලයින්ගේ සුභසාධනය පිළිබඳ ඇගයීමක් සිදුකෙරෙන අතර, අධ්‍යාපනය සහ සේවානියුක්තිය යන ක්ෂේත්‍ර මගින් වයස්ගත වූවන්ගේ දක්ෂතා සහ ශක්‍යතා ඇගයීමත් ජීවත් වීමට අවැසි පරිසරය යන ක්ෂේත්‍රය මගින් වයස්ගත වූවන්ට සුදුසු සමාජයීය පරිසරයක් නිර්මාණය වී ඇත්දැයි සහ ඔවුන්ගේ සමාජමය සම්බන්ධතා පිළිබඳව ඇගයීමත් සිදු වේ.

1. විශ්‍රාම ආදායම් ආවරණය

''අර්ථලාභීන්ගේ'' ආවරණ අනුපාතය ලෙසින් ද හඳුන්වන මෙම දර්ශකය මගින් රටක විශ්‍රාම ක්‍රමයේ පැවැත්ම සහ ආවරණය මනිනු ලබයි. එයින් විස්තර කෙරෙන්නේ වයස්ගත ජනගහනයෙන් කොපමණ ප්‍රතිශතයක් විශ්‍රාම ආදායම් ලබයි ද යන්න යි.

2. වියපත් වියේදී දරිද්‍රතා වේගය

මෙම දර්ශකය මගින් වයස්ගත පුද්ගලයන්ගේ දරිද්‍රතාව මනිනු ලබයි. එයින් දරිද්‍රතා රේඛාවට පහළින් සිටින කුටුම්භවල අවුරුදු 60 ට වැඩි ජනතාවගේ ප්‍රතිශතාත්මක අගය ගනු ලබයි.

3. වියපත් ජනගහනයේ සාපේක්ෂ සුභසාධනය

මෙම දර්ශනය මගින් රටක සෙසු ජනගහනයට සාපේක්ෂව වයස්ගත පුද්ගලයන්ගේ ආදායම්/පරිභෝජනයේ තත්ත්වය පිළිබඳ මැනීමක් සිදුකරයි.

4. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය

මෙමගින් හැඟෙනුයේ රටක මුළු නිෂ්පාදිතය එරටෙහි තරුණ සහ වයස්ගත ජනගහනය අතර සමාන අයුරින් බෙදී යා යුතු බවයි.

5. අවුරුදු 60 දී ආයු අපේක්ෂාව

මෙම දර්ශකය මගින් විස්තර කෙරෙනුයේ, වයස් අනුව මරණ අනුපාතිකය ස්ථාවරව පවතී යැයි උපකල්පනය කරමින් යම් පුද්ගලයකුගේ වයස අවුරුදු 60 දී ජීවිත අපේක්ෂාවයි.

6. අවුරුදු 60 දී සෞඛ්‍ය සම්පන්න ජීවිතයක අපේක්ෂාව

මෙයින් හඳුන්වනුයේ, ''දුබලතාවන් ගලපන ලද ජීවිත අපේක්ෂාවයි''. විවිධ සෞඛ්‍ය මට්ටම් සඳහා දෘෂ්‍ය බර තැබීම භාවිත කරමින්, දුබලතා හේතුවෙන් ඇතිවන අවාසි සැලකිල්ලට ගෙන මෙම දර්ශකය ගොඩනංවා ඇත.

7. මානසික සුවය

මෙම දර්ශකය මගින් ස්වයං තක්සේරු කරන ලද මානසික සුවය පිළිබඳ මැනීමක් කරනු ලබන අතර ම සෞඛ්‍ය සම්පන්න ජීවිත අපේක්ෂාව පිළිබඳ දර්ශකය සඳහා ඌනපූරකයක් ද සපයනු ලබයි.

8. වියපත් ජනගහනයේ සේවා නියුක්තිය

මෙමගින් වියපත් ජනතාවට ශ්‍රම වෙළෙඳපොළට ප්‍රවේශවීමට ඇති හැකියාවත්, විශ්‍රාම ආදායමට ඌනපූරකයක් ලෙස වෙනත් වැටුපක් ලබාගැනීමේ හැකියාව සහ රැකියාව හා බැඳුනු වෙනත් ජාලයන්ට ප්‍රවේශවීමේ හැකියාව පිළිබඳවත් සලකා බැලේ.

9. වියපත් ජනගහනයේ අධ්‍යාපන තත්ත්වය

වියපත් ජනතාවගේ ද්විතීයික හෝ ඉහළ අධ්‍යාපන මට්ටම්වල ප්‍රතිශතය පිළිබඳව මෙහි දී සලකා බලයි.

10. සමාජ සම්බන්ධතාව

මෙම දර්ශකයෙන් වයස්ගත පුද්ගලයන්ට තම ඥාතීන්, හිතවතුන් සහ මිතුරන්ගෙන් ඇති සහයෝගය සහ බැඳීම පිළිබඳව සලකා බලයි.

11. ශාරීරික සුරක්ෂිතතාව

වයස්ගත ජනතාවට තමා ජීවත්වන වටපිටාවෙන් එනම් අසල්වැසියන් ආදීන්ගෙන් ඇති සුරක්ෂිතතාව පිළිබඳව මැනීමක් මෙම දර්ශකය තුළින් සිදුකරනු ලබයි.

12. නිදහසේ ජීවත්විය හැකි වීම

වයස්ගත පුද්ගලයන්ට ස්වයං තීරණ ගැනීමට ඇති සමාජයීය නිදහස පිළිබඳව සලකා බැලීමක් මෙහිදී සිදු කරනු ලබයි. එනම් වයස්ගත පුද්ගලයන්ට ඇති සමාජයීය නිදහස පිළිබඳව ඔවුන්ට ඇති තෘප්තිමත් භාවයයි.

13. පොදු ප්‍රවාහනය සඳහා ප්‍රවේශවීමේ හැකියාව

වයස්ගත ජනතාවට ගුණාත්මක පොදු ප්‍රවාහන සේවයක් ලබාගැනීමට ඇති හැකියාව පිළිබඳව මැනීමක් මෙමගින් සිදුකරනු ලබයි. මන්ද එය ප්‍රධාන වශයෙන්ම වයස්ගත ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවයට බලපෑමක් සිදුකරන බැවිනි.

**දර්ශකය ගණනය කිරීම**

ඉහතින් දක්වන ලද ආදායම් සුරක්ෂිතතාව, සෞඛ්‍ය මට්ටම, අධ්‍යාපනය සහ සේවානියුක්තියත සහ ජීවත්වීමට අවැසි පරිසරය යන ක්ෂේත්‍ර 4 හි ''ගුණෝත්තර මධ්‍යන්‍යය'' මගින් සමස්ත දර්ශක අගය ගණනය කරනු ලබයි.

ගුණෝත්තර මධ්‍යන්‍යය ගණනය කිරීමේ දී ක්ෂේත්‍ර 4 සඳහා සමාන බර තැබීමක් ද ක්ෂේත්‍රය තුළ ඇති දර්ශකවල සාපේක්ෂ වැදගත්කම මත පදනම්ව පහත සඳහන් ආකාරයෙන් ද බර තබා ඇත.

මෙම දර්ශකයට අනුව වයස්ගත වූවන්ට ජීවත්වීම සඳහා සුදුසු ම රට වනුයේ ස්විඩනය යි. එහි දර්ශක අගය සියයට 89.9 වේ.

**ආදායම් සුරක්ෂිතතාව**

| | |
|---|---|
| විශ්‍රාම ආදායම් ආවරණය | - 40% |
| වියපත් වියේදී දරිද්‍රතා වේගය | - 20% |
| වියපත් ජනගහනයේ සාපේක්ෂ ශුභසාධනය | - 20% |
| ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතය | - 20% |

**සෞඛ්‍ය මට්ටම**

| | |
|---|---|
| අවුරුදු 60 දී ආයු අපේක්ෂාව | - 40% |
| අවුරුදු 60 දී සෞඛ්‍ය සම්පන්න දිවියක අපේක්ෂාව | - 40% |
| මානසික සුවය | - 20% |

**අධ්‍යාපනය හා සේවා නියුක්තිය**

| | |
|---|---|
| වියපත් ජනගහනයේ සේවා නියුක්තිය | - 50% |
| වියපත් ජනගහනයේ අධ්‍යාපන තත්ත්වය | - 50% |

**ජීවත්වීමට අවැසි පරිසරය**

| | |
|---|---|
| සමාජ සම්බන්ධතාව | - 25% |
| ශාරීරික සුරක්ෂිතතාව | - 25% |
| නිදහසේ ජීවත් විය හැකි වීම | - 25% |
| පොදු ප්‍රවාහනය සඳහා ප්‍රවේශවීමේ හැකියාව | - 25% |

**සංඛ්‍යා සටහන 1**

| රට | සමස්ත දර්ශකය | | ආදායම් සුරක්ෂිතතාව | | සෞඛ්‍ය මට්ටම | | සේවා නියුක්තිය සහ අධ්‍යාපනය | | ජීවත් වීමට අවැසි පරිසරය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රේණිය | අගය | ශ්‍රේණිය | අගය | ශ්‍රේණිය | අගය | ශ්‍රේණිය | අගය | ශ්‍රේණිය | අගය |
| ස්වීඩනය | 1 | 89.9 | 8 | 87.0 | 7 | 74.8 | 5 | 74.3 | 5 | 83.3 |
| නෝර්වේ | 2 | 89.8 | 3 | 91.4 | 13 | 73.5 | 1 | 85.4 | 22 | 76.2 |
| ජර්මනිය | 3 | 89.3 | 9 | 86.1 | 6 | 75.2 | 6 | 73.7 | 6 | 82.8 |
| නෙදර්ලන්තය | 4 | 88.2 | 4 | 90.9 | 18 | 71.3 | 11 | 66.2 | 1 | 85.6 |
| කැනඩාව | 5 | 88.0 | 26 | 81.1 | 2 | 80.3 | 9 | 69.6 | 9 | 82.3 |
| ස්විට්සර්ලන්තය | 6 | 87.9 | 28 | 80.6 | 1 | 81.3 | 12 | 66.1 | 4 | 84.0 |
| නවසීලන්තය | 7 | 84.5 | 43 | 72.7 | 3 | 78.7 | 7 | 71.1 | 13 | 80.2 |
| ඇමෙරිකාව | 8 | 83.8 | 36 | 77.9 | 24 | 70.1 | 2 | 76.6 | 16 | 78.2 |
| අයිස්ලන්තය | 9 | 83.4 | 15 | 84.7 | 9 | 74.2 | 18 | 58.5 | 7 | 82.5 |
| ජපානය | 10 | 83.1 | 27 | 80.7 | 5 | 76.9 | 10 | 66.2 | 19 | 77.2 |
| ඔස්ට්‍රියාව | 11 | 79.8 | 5 | 88.2 | 17 | 72.7 | 42 | 45.5 | 2 | 85.3 |
| අයර්ලන්තය | 12 | 79.5 | 24 | 81.9 | 14 | 73.1 | 32 | 49.4 | 3 | 84.0 |
| එක්සත් රාජධානිය | 13 | 78.7 | 10 | 85.8 | 19 | 71.0 | 24 | 53.8 | 17 | 78.1 |
| ඔස්ට්‍රේලියාව | 14 | 77.2 | 57 | 57.2 | 4 | 78.2 | 4 | 76.3 | 25 | 73.5 |
| ෆින්ලන්තය | 15 | 77.1 | 14 | 84.8 | 21 | 70.8 | 27 | 51.4 | 18 | 77.4 |
| ලක්සම්බර්ග් | 16 | 76.7 | 1 | 98.2 | 16 | 72.7 | 55 | 38.4 | 11 | 81.2 |
| ඩෙන්මාර්කය | 17 | 75.9 | 21 | 82.3 | 40 | 57.5 | 20 | 55.7 | 10 | 82.2 |
| ප්‍රංශය | 18 | 75.0 | 2 | 93.2 | 31 | 63.6 | 41 | 45.6 | 15 | 78.8 |
| චිලී දේශය | 19 | 70.6 | 42 | 74.2 | 10 | 74.2 | 23 | 53.9 | 39 | 67.1 |
| ස්ලෝවීනියාව | 20 | 70.5 | 22 | 82.0 | 32 | 63.2 | 51 | 39.3 | 12 | 80.7 |
| ඊශ්‍රායලය | 21 | 70.0 | 56 | 58.4 | 20 | 70.9 | 13 | 63.7 | 31 | 69.8 |
| ස්පාඤ්ඤය | 22 | 67.6 | 31 | 79.7 | 39 | 57.6 | 50 | 39.4 | 14 | 79.1 |
| උරුගුවේ | 23 | 67.4 | 18 | 83.3 | 33 | 63.1 | 29 | 51.1 | 42 | 65.4 |
| බෙල්ජියම | 24 | 67.0 | 41 | 74.4 | 23 | 70.2 | 45 | 41.9 | 29 | 70.3 |
| චෙක් රාජ්‍යය | 25 | 62.5 | 13 | 85.4 | 38 | 58.5 | 22 | 54.2 | 61 | 58.6 |
| ආර්ජෙන්ටිනාව | 26 | 61.7 | 11 | 85.7 | 37 | 59.4 | 34 | 48.7 | 59 | 59.4 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉතාලිය | 27 | 61.4 | 6 | 88.0 | 15 | 73.0 | 62 | 33.1 | 53 | 61.9 |
| කොස්ටරිකාව | 28 | 61.2 | 60 | 53.3 | 11 | 74.2 | 48 | 40.4 | 34 | 69.1 |
| එස්තෝනියාව | 29 | 60.2 | 35 | 78.0 | 58 | 44.5 | 8 | 70.7 | 62 | 58.4 |
| පැනමාව | 30 | 59.1 | 55 | 59.2 | 25 | 69.8 | 46 | 41.8 | 48 | 63.4 |
| බ්‍රසීලය | 31 | 58.9 | 12 | 85.7 | 41 | 56.8 | 68 | 31.5 | 40 | 66.7 |
| ඉක්වදෝරය | 32 | 58.6 | 58 | 54.8 | 12 | 73.8 | 49 | 39.7 | 44 | 64.3 |
| මොරිෂස් | 33 | 58.0 | 7 | 87.2 | 56 | 45.0 | 66 | 32.2 | 26 | 71.8 |
| පෘතුගාලය | 34 | 57.8 | 17 | 83.4 | 29 | 67.4 | 76 | 24.6 | 37 | 67.4 |
| චීනය | 35 | 57.4 | 66 | 46.2 | 51 | 52.0 | 40 | 45.7 | 24 | 74.6 |
| ශ්‍රී ලංකාව | 36 | 57.3 | 67 | 44.9 | 45 | 55.1 | 37 | 47.9 | 27 | 71.3 |
| ජෝර්ජියාව | 37 | 56.5 | 45 | 72.1 | 68 | 37.7 | 14 | 62.9 | 54 | 61.6 |
| මෝල්ටාව | 38 | 55.8 | 37 | 76.8 | 27 | 68.0 | 77 | 24.4 | 41 | 65.7 |
| ඇල්බේනියාව | 39 | 55.5 | 23 | 82.0 | 63 | 39.6 | 30 | 51.0 | 56 | 60.6 |
| හංගේරියාව | 40 | 54.7 | 19 | 83.2 | 57 | 45.0 | 39 | 47.0 | 65 | 57.8 |
| ක්‍රොයේෂියාව | 41 | 53.1 | 51 | 61.3 | 43 | 56.5 | 52 | 39.1 | 57 | 60.0 |
| තායිලන්තය | 42 | 53.0 | 59 | 53.3 | 46 | 55.0 | 78 | 22.7 | 8 | 82.4 |
| පේරු රාජ්‍යය | 43 | 53.0 | 65 | 46.7 | 30 | 64.2 | 31 | 50.0 | 67 | 57.5 |
| පිලිපීනය | 44 | 52.8 | 73 | 37.5 | 70 | 36.9 | 17 | 58.6 | 21 | 76.3 |
| ලැට්වියාව | 45 | 52.5 | 33 | 79.2 | 62 | 40.6 | 15 | 62.3 | 77 | 53.3 |
| බොලිවියාව | 46 | 52.0 | 48 | 67.0 | 60 | 41.3 | 25 | 52.8 | 64 | 57.8 |
| බල්ගේරියාව | 47 | 51.7 | 32 | 79.4 | 59 | 44.2 | 44 | 44.0 | 71 | 56.2 |
| රුමේනියාව | 48 | 51.4 | 29 | 80.6 | 64 | 38.6 | 38 | 47.1 | 68 | 57.1 |
| ස්ලෝවැකියාව | 49 | 51.2 | 16 | 84.1 | 53 | 47.8 | 36 | 48.6 | 81 | 52.0 |
| ලිතුවේනියාව | 50 | 50.7 | 47 | 67.6 | 52 | 48.2 | 16 | 59.5 | 83 | 51.6 |
| ආර්මේනියාව | 51 | 50.5 | 40 | 75.3 | 75 | 33.0 | 3 | 76.5 | 80 | 52.6 |
| ටජිකිස්තානය | 52 | 49.8 | 50 | 66.2 | 79 | 31.3 | 28 | 51.1 | 50 | 62.4 |
| වියට්නාමය | 53 | 49.4 | 64 | 47.5 | 36 | 59.8 | 75 | 24.9 | 32 | 69.7 |
| කොලොම්බියාව | 54 | 49.3 | 68 | 44.9 | 26 | 69.5 | 63 | 32.7 | 58 | 59.5 |
| නිකරගුවාව | 55 | 49.0 | 74 | 35.8 | 42 | 56.7 | 65 | 32.5 | 28 | 70.8 |
| මෙක්සිකෝව | 56 | 48.9 | 70 | 41.0 | 35 | 60.7 | 58 | 36.0 | 51 | 62.0 |
| සයිප්‍රසය | 57 | 48.2 | 80 | 22.0 | 22 | 70.7 | 47 | 40.6 | 30 | 70.2 |
| ග්‍රීසිය | 58 | 47.4 | 25 | 81.2 | 47 | 54.1 | 61 | 33.4 | 82 | 51.6 |
| එල් සැල්වඩෝරය | 59 | 46.7 | 72 | 38.9 | 34 | 62.7 | 72 | 28.2 | 46 | 64.1 |
| බේලාරුසය | 60 | 46.6 | 44 | 72.1 | 80 | 31.0 | 57 | 37.6 | 52 | 61.9 |
| වෙනිසියුලාව | 61 | 46.2 | 63 | 49.4 | 28 | 67.7 | 64 | 32.6 | 74 | 54.0 |
| පෝලන්තය | 62 | 45.9 | 20 | 82.6 | 87 | 23.9 | 54 | 38.8 | 43 | 64.8 |
| කිර්ගිස්තානය | 63 | 44.3 | 49 | 66.8 | 83 | 27.5 | 26 | 51.7 | 70 | 56.3 |
| සර්බියාව | 64 | 42.4 | 52 | 60.7 | 54 | 47.1 | 71 | 28.7 | 73 | 54.0 |
| දකුණු අප්‍රිකාව | 65 | 41.0 | 46 | 69.2 | 74 | 33.2 | 60 | 34.2 | 75 | 53.7 |
| යුක්රේනය | 66 | 40.2 | 39 | 75.3 | 77 | 31.8 | 35 | 48.7 | 86 | 48.3 |
| දකුණු කොරියාව | 67 | 39.9 | 90 | 8.7 | 8 | 74.5 | 19 | 56.3 | 35 | 68.3 |
| ඩොමිනිකානු රාජ්‍යය | 68 | 39.3 | 79 | 22.3 | 49 | 52.3 | 69 | 31.3 | 45 | 64.2 |
| ඝානාව | 69 | 39.2 | 81 | 21.3 | 67 | 38.3 | 33 | 48.8 | 49 | 63.1 |
| තුර්කිය | 70 | 38.1 | 30 | 79.7 | 66 | 38.3 | 84 | 14.5 | 60 | 58.7 |
| ඉන්දුනීසියාව | 71 | 37.9 | 83 | 16.7 | 65 | 38.5 | 59 | 35.6 | 20 | 76.6 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පැරගුවේ | 72 | 35.0 | 86 | 15.0 | 44 | 55.8 | 53 | 38.9 | 66 | 57.6 |
| ඉන්දියාව | 73 | 35.0 | 54 | 59.4 | 85 | 24.4 | 73 | 27.9 | 72 | 56.1 |
| මොංගෝලියාව | 74 | 34.8 | 38 | 75.7 | 89 | 20.6 | 56 | 38.3 | 85 | 51.3 |
| ගෝතමාලාව | 75 | 34.0 | 77 | 23.5 | 50 | 52.1 | 81 | 17.7 | 47 | 63.5 |
| මෝල්ඩෝව | 76 | 33.8 | 53 | 59.9 | 71 | 35.1 | 43 | 44.7 | 89 | 45.0 |
| නේපාලය | 77 | 33.7 | 62 | 49.9 | 82 | 29.4 | 79 | 22.0 | 69 | 56.5 |
| රුසියාව | 78 | 30.8 | 69 | 43.0 | 78 | 31.3 | 21 | 55.7 | 90 | 44.4 |
| ලාවෝසය | 79 | 29.4 | 76 | 24.1 | 81 | 29.9 | 82 | 15.8 | 33 | 69.2 |
| කාම්බෝජියාව | 80 | 27.3 | 85 | 16.4 | 88 | 23.2 | 80 | 21.2 | 23 | 75.0 |
| මොරොක්කෝව | 81 | 26.6 | 71 | 39.0 | 76 | 31.8 | 83 | 14.7 | 84 | 51.4 |
| හොන්ඩුරාසය | 82 | 25.8 | 88 | 9.6 | 48 | 53.9 | 74 | 27.8 | 78 | 53.2 |
| මොන්ටෙනේග්‍රෝව | 83 | 25.5 | 34 | 78.1 | 55 | 45.9 | 89 | 6.7 | 87 | 47.4 |
| බටහිර ඉවුර සහ ගාසාව | 84 | 24.5 | 78 | 22.9 | 72 | 34.1 | 86 | 10.2 | 55 | 60.6 |
| නයිජීරියාව | 85 | 24.0 | 87 | 14.2 | 84 | 26.4 | 70 | 30.5 | 76 | 53.6 |
| මාලාවිය | 86 | 17.8 | 89 | 9.5 | 86 | 24.1 | 85 | 13.9 | 63 | 57.8 |
| රුවන්ඩාව | 87 | 16.6 | 82 | 19.0 | 90 | 19.3 | 90 | 5.3 | 38 | 67.2 |
| ජෝර්දානය | 88 | 11.4 | 61 | 52.7 | 61 | 40.9 | 91 | 1.6 | 36 | 68.0 |
| පකිස්තානය | 89 | 8.3 | 84 | 16.7 | 69 | 37.7 | 67 | 32.0 | 91 | 39.8 |
| ටැන්සානියාව | 90 | 4.6 | 91 | 2.1 | 73 | 33.7 | 88 | 7.3 | 79 | 52.9 |
| ඇෆ්ගනිස්තානය | 91 | 3.3 | 75 | 24.2 | 91 | 7.6 | 87 | 9.4 | 88 | 46.2 |

ශ්‍රේණිගත කිරීම් සඳහා යොදා ගත් රටවල් 91 අතරින් ආදායම් සුරක්ෂිතතාව අනුව ලොව 8 වන ස්ථානය ද සෞඛ්‍ය මට්ටම අතින් ලොව 7 වන ස්ථානය ද අධ්‍යාපනය සහ සේවානියුක්තිය සහ ජීවත් වීමට අවැසි පරිසරය යන ක්ෂේත්‍රවලින් ලොව 5 වන ස්ථානය ද අත්කරගෙන ඇත්තේ ස්විඩනය යි.

මෙම රටවල් 91 අතරින් අවසාන ස්ථානයට පත්ව ඇත්තේ එනම් වයස්ගත වූවන්ට ජීවත්වීම සඳහා නුසුදුසු ම රට වනුයේ ඇෆ්ගනිස්ථානය යි. එම රට ආදායම් සුරක්ෂිතතාව අතින් 75 වන ස්ථානයට ද සෞඛ්‍ය මට්ටම අතින් 91 එනම් පහළම ස්ථානයට ද අධ්‍යාපනය සහ සේවානියුක්තිය යන ක්ෂේත්‍රයෙන් 87 වැනි ස්ථානයට ද ජීවත් වීමට අවැසි පරිසරය යන ක්ෂේත්‍රයෙන් 88 වැනි ස්ථානයට ද පත්වී ඇත.

මෙම දර්ශකයට අනුව ස්විඩනය, නෝර්වේ, ජර්මනිය, නෙදර්ලන්තය සහ කැනඩාව වයස්ගත පුද්ගලයන්ට ජීවත්වීම සඳහා ලොව සුදුසු ම රටවල් පහ වන අතර, රුවන්ඩාව, ජෝර්දානය, පකිස්ථානය, ටැන්සානියාව සහ ඇෆ්ගනිස්ථානය වයස්ගත පුද්ගලයන්ට ජීවත්වීම සඳහා ලොව නුසුදුසු ම රටවල් පහ වශයෙන් වාර්තා වේ.

දර්ශකය නිර්මාණය කිරීම සඳහා යොදාගත් ක්ෂේත්‍ර පිළිබඳ වෙන් වෙන්ව සලකා බැලීමේ දී ආදායම් සුරක්ෂිතතාව අතින් ලොව ඉහළ රට ලක්සම්බර්ග් වේ. එසේම එහි පහළ රට වනුයේ ටැන්සානියාව යි. සෞඛ්‍ය මට්ටම යන ක්ෂේත්‍රයෙන් ලොව ඉහළ රට ස්විට්සර්ලන්තය වන අතර ඇෆ්ගනිස්ථානය එහි පහළ ම මට්ටමේ පවතී.

අධ්‍යාපනය සහ සේවානියුක්තිය යන ක්ෂේත්‍රයෙන් ලොව ඉහළ ම රට වනුයේ නෝර්වේ රාජ්‍යය යි. එහි පහළ රට වනුයේ ජෝර්දානය යි. එසේම ජීවත් වීමට අවැසි පරිසරය යන ක්ෂේත්‍රයෙන් ලොව පළමු වැනි ස්ථානය නෙදර්ලන්තය අත්කරගෙන ඇති අතර, අතර 91 වැනි ස්ථානයට පත්ව ඇත්තේ පකිස්ථානය යි.

## ශ්‍රී ලංකාවේ තත්ත්වය

සමස්ත දර්ශකයට අනුව ශ්‍රී ලංකාව 36 වැනි ස්ථානයට පත්ව ඇති අතර, දකුණු ආසියාවේ රටවල් අතරින් ප්‍රථම ස්ථානය අත්කර ගැනීමට ද හැකියාව ලැබී ඇත. ශ්‍රී ලංකාවේ සමස්ත දර්ශක අගය සියයට 57.3 වේ. මෙයින් හැඟෙනුයේ වයස්ගත වූවන්ගේ සුභසාධනය සියයට 57.3 ක මට්ටමෙහි පවතින බවයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ දර්ශක අගය ලොව ඉහළ ම අගය, එනම් 89.9 ලබා ඇති ස්විඩනයේ දර්ශක අගයට වඩා 32.6 කින් අඩුය. එසේම මෙම දර්ශකය දෙස බැලීමේ දී, රටවල් 91 අතරින් ශ්‍රී ලංකාව ආදායම් සුරක්ෂිතතාව අතින් ලොව 67 වන ස්ථානය ද, සෞඛ්‍ය මට්ටම අතින් 45 වැනි ස්ථානය ද, අධ්‍යාපනය සහ සේවානියුක්තිය යන අංශයෙන් 37 වන ස්ථානය ද, ජීවත් වීමට අවැසි පරිසරය යන අංශයෙන් 27 වැනි ස්ථානයට ද පත්ව ඇත. මෙයින් හැඟෙනුයේ ශ්‍රී ලංකාවේ වයස්ගත පුද්ගලයින්ගේ සමාජ සබඳතා, ශාරීරික සුරක්ෂිතතාව සහ සමාජයීය නිදහස ඉහළ මට්ටමක පවතින බවත්, තවදුරටත් වයස්ගත පුද්ගලයන්ගේ ආදායම් සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීමට ක්‍රියා මාර්ග ගත යුතු බවත් ය.


මේ අනුව, මෙම දර්ශකය මගින් ලොවපුරා රටවල වයස්ගත පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය පිළිබඳ හොඳ අවබෝධයක් ලබා ගත හැක. එසේම ප්‍රතිපත්ති සම්පාදනයේ දී, තවදුරටත් දියුණු කළ යුතු අංශ හඳුනා ගැනීම සඳහා මාර්ගෝපදේශ ද සපයනු ලබයි. උදාහරණයක් ලෙස, වර්තමානයේ දී සහ අනාගතයේ දී මුහුණ දිය හැකි අභියෝග සඳහා යුරෝපීය රටවල් තවදුරටත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගතයුතුව ඇත. මන්ද යත් මෙම දර්ශකයට අනුව යුක්රේනය (66 වැනි ස්ථානය) සහ රුසියාව (78 වැනි ස්ථානය) පහළ මට්ටමක පවතින බැවිනි.

එසේම, ලතින් ඇමරිකානු රටවල වර්ෂ 2050 වන විට වයස්ගත ජනගහනය දෙගුණවීමක් සිදුවිය හැකි අතර, එම රටවල් දර්ශකයේ ඉහළ අගයක් ගෙන ඇතත් සමහර රටවල් දර්ශකයේ පහළ අගයක් ගෙන ඇත. උදාහරණයක් ලෙස චිලි දේශය 19 වැනි ස්ථානය ද, උරුගුවේ 23 වැනි ස්ථානය ද, ආජන්ටිනාව 26 වැනි ස්ථානය ද අත්කරගෙන ඇති නමුත් පැරගුවේ 72 වැනි ස්ථානයට ද, ගෝතමාලාව 75 වැනි ස්ථානයට පත්ව ඇත. එම නිසා, මෙම කලාපීය රටවල් තවදුරටත් මේ පිළිබඳව සලකා බැලිය යුතුව ඇත.

එබැවින් මෙම දර්ශකය ගෝලීය වශයෙන්, කලාපීය වශයෙන් සහ වෙන් වෙන්ව රටවල් වශයෙන් වයස්ගත පුද්ගලයන් මුහුණ දෙන දුෂ්කරතා සහ ප්‍රශ්න හඳුනා ගැනීමට උපකාරී වන අතර ඒ තුළින් අදාළ ගැටලු සඳහා විසඳුම් ලබා දී වයස්ගත වූවන්ට ඉතා හොඳ ගුණාත්මක ජීවිතයක් ගතකිරීමට අවශ්‍ය පසුබිම සකස් කර දීමට මහෝපකාරී වේ.

(Global AgeWatch Index 2013 – Insight report සහ Purpose, methodology and result. යන වාර්තා අසුරිනි)

**වයස අවුරුදු 60 ට වැඩි ජනගහනය**
**2012 සහ 2050**




(මූලාශ්‍රය: *Global AgeWatch Index 2013 Insight Report)*

# ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුම (Business Continuity Plan)

**රුමේෂ් වික්‍රමසිංහ**, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව.

වර්තමාන දියුණු ලෝකය තුළ ව්‍යාපාර සංවිධාන කටයුතු කරගෙන යනු ලබන්නේ ඉතා තරඟකාරී පසුබිමක් තුළ ය. ස්වාභාවික හේතූන් මත මෙන් ම මිනිසුන් විසින් ම නිර්මාණය කරන තත්ත්වයන් තුළ ඕනෑම අවස්ථාවක ආපදාමය තත්ත්වයන් ඇතිවිය හැක. එවැනි ආපදා තත්ත්වයන්ගෙන් ඇතිවන වඩාත් ම අහිතකර තත්ත්වය නම් ව්‍යාපාර කටයුතුවල අඛණ්ඩතාව බිඳ වැටීමයි. එම නිසා තම ව්‍යාපාරයේ අඛණ්ඩතාව ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීම ඉතා වැදගත් වේ. එය ව්‍යාපාරයේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය මූලිකාංග යක් ලෙස හඳුන්වා දිය හැක.

ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක් සාර්ථකව ක්‍රියාකාරී තත්ත්වයකට පත්කරන්නේ කෙසේ ද, ඒ සඳහා අනුගමනය කළ යුතු, පසුකළ යුතු අදියර මොනවා ද යන්න අප මෙහි දී සාකච්ඡා කරන අතර ඒ සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම හා එහි ප්‍රධාන අදියර වන ව්‍යාපෘති ආරම්භය, ව්‍යාපාරික අවදානම් විශ්ලේෂණය, පූර්ව පාලන ක්‍රම හඳුනා ගැනීම, යථාතත්ත්වයට පත්වීමේ උපාය මාර්ග නිශ්චය කිරීම, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම සැකසීම, පරීක්ෂාව, පුහුණුව හා දැනුවත් බව හා සැලසුම නඩත්තු කිරීම පිළිබඳව මෙන් ම සාර්ථක ව්‍යාපාර අඛණ්ඩතා ක්‍රියාවලියක් සඳහා එහි අන්තර්ගත විය යුතු ගුණාත්මක ලක්ෂණ පිළිබඳව ද විස්තර කෙරේ. සාකච්ඡා කරනු ලබන සියළුම කරුණු පිළිබඳ සාරාංශයක් ද මෙම ලිපිය අවසානයෙ හි දැක්වේ.

### ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක දැකිය හැකි වැදගත් පියවර

සාර්ථක ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් මගින් ආයතනයේ දෛනික ව්‍යාපාර කටයුතු පිළිබඳ වැඩි විශ්වාසයක් තහවුරු කර ගැනීමට අවස්ථාව ලැබේ. එවැනි සාර්ථක ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක දැකිය හැකි පියවර පහත සඳහන් පරිදි වේ.

1. ව්‍යාපෘති ආරම්භය
2. ව්‍යාපාරික අවදානම් විශ්ලේෂණය
3. පූර්ව පාලන ක්‍රම හඳුනා ගැනීම
4. යථාතත්ත්වයට පත්වීමේ උපාය මාර්ග නිශ්චය කිරීම
5. ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම සැකසීම
6. පරීක්ෂා කිරීම, දැනුවත් බව හා පුහුණුව
7. සැලසුම නඩත්තු කිරීම.

### 01. ව්‍යාපෘති ආරම්භය

ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක අවශ්‍යතාව හඳුනා ගැනීමෙන් අනතුරුව ආයතනයක් විසින් සැලසුමක් සකස් කිරීම සඳහා වන ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය අංග සම්පූර්ණ කරගත යුතු ය. මෙම අදියරේ දී සම්පූර්ණ කරගත යුතු මූලික කාර්යයන් පහත පරිදි හඳුනාගත හැක.

➢ **ඉහළ කළමනාකාරිත්වයේ අනුමැතිය ලබාගැනීම**

ව්‍යාපාර අඛණ්ඩත්වයේ අවශ්‍යතාව ඉහළ කළමනාකාරිත්වයේ අවධානයට යොමු කිරීම මගින් ඒ සඳහා සැලසුමක් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සම්පත් වෙන්කර ගැනීමට මෙන් ම අනෙකුත් ක්‍රියාවලි සඳහා ආයතනික ධූරාවලිය

තුළ අනුමැතිය ලබාගත යුතු ය. ඊට අමතරව කළමනාකරිත්වයේ සහාය ද වඩා හොඳ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මකට අවශ්‍ය වේ.

➢ **ප්‍රතිපත්ති ප්‍රකාශන සැකසීම**

ප්‍රතිපත්ති ප්‍රකාශනයක වැදගත්කම වන්නේ ඉන් ඊට අදාළ ව්‍යාපෘතියේ හෝ ආයතනයේ හෝ නිශ්චිත වපසරිය තීරණය කිරීම යි. ව්‍යාපෘතියේ අරමුණු, පරාසය, වගකීම් හා සාමාජිකයන් පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය සැකසීම ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමකට අත්‍යාවශ්‍ය ය.

➢ **ව්‍යාපෘති කණ්ඩායම තෝරා ගැනීම**

ව්‍යාපාර අඛණ්ඩතාවයේ වැදගත්කම ආයතනයක සියළු ම අංශ වෙත විහිදී යයි. එම නිසා අඛණ්ඩතා සැලැස්ම සම්පාදනය කිරීම සඳහා වන ව්‍යාපෘති කණ්ඩායම ආයතනයේ සියළු ම අංශ නියෝජනය වන පරිදි තෝරාගත යුතු ය. මීට අමතරව ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන සම්බන්ධීකාරවරයකු ද තෝරාගත යුතු ය.

මේ ආකාරයට ව්‍යාපෘතිය සඳහා වන මූලික කටයුතු සම්පාදනය කර ගැනීමෙන් පසු මීළඟ අදියර වන අවදානම් විශ්ලේෂණය වෙත යොමුවිය හැක.

## 02. ව්‍යාපාරික අවදානම් විශ්ලේෂණය

ව්‍යාපාරික අවදානම් විශ්ලේෂණය කිරීම යම් තාක්ෂණික නැඹුරුවකින් යුක්ත වූවක් වන අතර එම නිසා ව්‍යාපෘති කණ්ඩායමට ආයතනයේ විවිධ අංශවලින් සාමාජිකයන් ඇතුළත් කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

අවදානම් විශ්ලේෂණය යනු ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර අවබෝධය සඳහා පහත දැක්වෙන පියවර මගින් මෙය සරලව විග්‍රහ කළ හැක.



**ආයතනය තුළ පවතින සියළු ම ව්‍යාපාර කටයුතු හා ක්‍රියාවලින් හඳුනා ගැනීමඃ-**

මෙහි දී ආයතනයේ එක් එක් අංශවල ක්‍රියාත්මක වන කටයුතු සියල්ල හඳුනා ගත යුතු ය. උදාහරණයක් ලෙස මූල්‍ය අංශයක කටයුතු පහත පරිදි හඳුනාගත හැක.

1. පාරිභෝගික ගිණුම් යාවත්කාලීන කිරීම
2. ආයෝජන කටයුතු
3. බිල්පත් සඳහා ගෙවීම
4. වැටුප් ගෙවීම
5. බැංකු ප්‍රකාශ විශ්ලේෂණය
6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

ඉහත ආකාරයට හඳුනාගත් එක් එක් කාර්යයන්ගේ අත්හළ හැකි උපරිම අඩපණ කාලය (Maximum Tolarable Down Time - MTD ) නිර්ණය කළ යුතු ය. මෙහි දී එක් එක් ක්‍රියාවලියේ අන්තර් සම්බන්ධතාව ද සලකා බැලිය යුතු ය.

මුලින් හඳුනා ගන්නා ලද හා ප්‍රමුඛතාව දෙන ලද කාර්යයන් ගේ අඛණ්ඩතාව බිඳහෙළිය හැකි අවදානම් මීළඟට හඳුනාගත යුතු ය. මෙහි දී ව්‍යාපෘති කණ්ඩායම තම අවධානය විවිධ අංශ වෙත යොමු කරමින් ඇතිවිය හැකි සියළු ම තත්ත්වයන් හඳුනා ගැනීමට උත්සාහ කළ යුතු ය.

**අවදානම් ශ්‍රේණිගත කිරීමඃ-**

ඉහත දැක්වූ ලෙස හඳුනාගත් අවදානම් ඇතිවීමේ හැකියාව (Probability) සහ ඇතිවීමෙන් එල්ලවන බලපෑම (Impact) යොදා ගනිමින් ශ්‍රේණිගත කළ යුතු ය. මේ සඳහා ව්‍යාපෘති කණ්ඩායම විසින් සකසා ගන්නා ලද ශ්‍රේණි යොදාගත හැක.

## 03. පූර්ව පාලන ක්‍රම හඳුනා ගැනීම

ඉහත අවදානම් විශ්ලේෂණයේ දී හඳුනා ගන්නා ලද සමහර අවදානම් සම්පූර්ණයෙන් ම ඉවත් කිරීමට හෝ එම අවදානම් ඇතිවීමේ හැකියාව හෝ බලපෑම අඩුකිරීමට හෝ යම් යම් පාලන හා ක්‍රම හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකාරිත්වයට යෝජනා හා නිර්දේශ සිදුකිරීම මෙම අදියරේ දී සිදු වේ. මෙම අදියරේ දී සිදුකරනු ලබන හඳුනා ගැනීම් නිසා ආයතනයේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වඩා සුමට වේ.

## 04. යථා තත්ත්වයට පත්වීමේ උපාය මාර්ග නිශ්චය කිරීම

මේ වන විට ව්‍යාපෘති කණ්ඩායම විසින් ආයතනයේ සියළු ම ක්‍රියාවලි හඳුනාගෙන ඒවාට බලපානු ලබන අවදානම් මෙන් ම එකී අවදානම් ඉවත් කිරීමට හෝ අඩු කිරීමට හෝ ක්‍රියාත්මක කළ යුතු පාලන ක්‍රියාමාර්ග ද හඳුනාගෙන ඇත. ඉන්පසු ඇත්තේ එම අවදානම් විශ්ලේෂණයේ ප්‍රමුඛතා පිළිබඳ සලකමින් එක් එක් ක්‍රියාවලි සඳහා අඛණ්ඩතාව රැක ගැනීමට උපාය මාර්ග සකස් කිරීම යි.

මෙහි දී අවධානය යොමු විය යුතු තවත් අංගයක් වන්නේ අදාළ ක්‍රියාවලීන් ගේ යථාතත්ත්වයට පත්විය යුතු වන්නේ කුමක් ද යන්න යි. පහත අංශ මේ යටතේ සාකච්ඡා කළ හැක.

- **ව්‍යාපාර ක්‍රියාවලි**

  එකිනෙකට සම්බන්ධව ක්‍රියාත්මක වන ක්‍රියාවලි යම් අවස්ථාවක දී බිඳී ගිය පසු නැවත එම ක්‍රියාවලි නිවැරදි ව සම්බන්ධ කරමින් යථාතත්ත්වයට පත් කළ යුතු ය. එසේ නොවුවහොත් තවදුරටත් අඛණ්ඩතාවයට හානි සිදුවිය හැක. මේ සඳහා මුල් අදියරවල දී මෙම ක්‍රියාවලි ඉතා හොඳින් අධ්‍යයනය කර හඳුනාගත යුතු ය.

- **පහසුකම්**

  ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑම සඳහා ප්‍රධාන කාර්යාලයේ/ව්‍යාපාර ස්ථානයේ/පරිශ්‍රයේ පහසුකම් නොමැති අවස්ථාවක දී ඒ සඳහා භාවිතා කිරීමට සියළු ම පහසුකම්වලින් සම්පූර්ණව ද්විතියික සැලැස්මක් තිබිය යුතුය. ප්‍රවාහන, පරිශ්‍ර, නඩත්තු, ආපනශාලා ආදී සියළු ම පහසුකම් මෙමගින් ආවරණය විය යුතු ය.

- **සැපයුම් හා තාක්ෂණික සේවා**

  විදුලි බලය, පරිගණක දෘඩාංග, ජාලගත කිරීම, අනෙකුත් ලිපි ද්‍රව්‍ය ආදී සියල්ල ද්විතීයික පරිශ්‍රයේ සූදානම් කර තිබිය යුතු අතර ඒ සඳහා තාක්ෂණික දැනුම සහිත කණ්ඩායම් යොදා ගත යුතු ය.

- **මානව සම්පත්**

  ආපදා තත්ත්වයෙන් ඉතා ඉක්මනින් ආරම්භ කළ යුතු මෙහෙයුම්වල සිට අනෙකුත් සියළු ම ක්‍රියාවලි අඛණ්ඩව ව්‍යාපාරික තත්ත්වට ගෙන ඒම සඳහා මානව සම්පත

ඉතා වැදගත් වේ. එම නිසා අවශ්‍ය මානව සම්පත් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව හඳුනාගත යුතු ය.

- **තොරතුරු හා දත්ත**

  ක්‍රියාවලි අඛණ්ඩව පවත්වාගෙ යෑම සඳහා අවශ්‍ය තොරතුරු හා දත්ත මූලාශ්‍ර ආරක්ෂා කළ යුතු අතර ඒවා ආපදා අවස්ථාවක දී ක්‍රියාකාරී තත්ත්වයට පත් කර ගැනීමට ද කටයුතු කළ යුතු ය.

  ක්‍රියාවලීන්ගේ ප්‍රමුඛතාව අනුව ඉහත අංශ යථාතත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කළ යුතු අතර මේ සඳහා වෙනස් වගකීම්වලින් සමන්විත වූ ප්‍රතිපූර්ණ කණ්ඩායම් තුනක් සහභාගි වේ.

- **මෙහෙයුම් යථාතත්ත්වයට පත් කිරීමේ කණ්ඩායම**

  ද්විතීයික පහසුකම් භාවිතා කරමින් ව්‍යාපාර කටයුතු නැවත අරඹයි.

- **ආපදා ඇස්තමේන්තු කිරීමේ කණ්ඩායම**

  මොවුන් ආපදාව හෝ බාධාකාරී සිදුවීම හෝ නිසා වූ හානි ඇස්තමේන්තුගත කරයි.

- **ආපදා ප්‍රතිපූරණය කිරීමේ කණ්ඩායම**

  ප්‍රධාන පරිශ්‍රය/ව්‍යාපාර ස්ථානය තුළ නැවත ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සඳහා කටයුතු කරයි.

මේ ආකාරයට යථාතත්ත්වයට පත්වීමේ උපාය මාර්ග සැකසීමෙන් පසුව ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම ලේඛනගත කළ යුතු ය.

## 05. ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම සැකසීම

ඉහත අදියරවල දී හඳුනාගෙන ඇති ක්‍රියාවලි, අවදානම්, පාලන ක්‍රම සහ යථාතත්ත්වයට පත්වීමේ උපාය මාර්ග භාවිතා කරමින් සැලසුම ලේඛනගත කිරීම මෙම අදියරේ දී සිදු වේ. මෙම සැලැස්ම ප්‍රායෝගිකව පරීක්ෂා කිරීම හා පුහුණුකිරීම් සිදුවන්නේ කෙසේ ද යන්න මෙන් ම එක් එක් කාර්ය සඳහා වගකීම් විමධ්‍යගත වන්නේ කෙසේ ද යන කරුණු මෙහි ඇතුළත් විය යුතු ය. මෙය ආයතනයේ හඳුනාගත් මානව සම්පත් කාණ්ඩය වෙත කවර හෝ මාධ්‍යයකින් (මුද්‍රිත/විද්‍යුත්) ළඟාවිය යුතු ලේඛනයකි. මෙසේ ලේඛනගත කළ සැලසුම මීළඟ අදියරේ දී එහි සාර්ථක බව පිළිබඳ පරීක්ෂණයට භාජනය වේ.

## 06. පරීක්ෂාව, පුහුණුව හා දැනුවත්බව

ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක් පරීක්ෂා කළ හැකි ක්‍රම පහකි මෙම ක්‍රම පහට ම අනුව සැලැස්ම විවිධ අවස්ථාවල පරීක්ෂණයට ලක්විය යුතු ය.

**පිරික්සුම් ලැයිස්තුව පරීක්ෂාව** :

සැලැස්ම තුළ එක් එක් අංශයේ කටයුතු සියල්ල හඳුනා ගෙන ඇත් ද යන්න ඒ ඒ අංශවල කළමනාකාරිත්වය මගින් මෙහි දී පරීක්ෂා කිරීම මෙම අවස්ථාවේ දී සිදු කෙරේ.

**ව්‍යුහාත්මක ක්‍රියාවලි පරීක්ෂාව** :

එක් එක් අංශවල නියෝජිතයින් එක්ව විවිධ තත්වයන්හි දී ඔවුනොවුන්ගේ ව්‍යාපාර කටයුතු අඩුපණවීමේ සිට නැවත ආරම්භ කිරීම දක්වා කණ්ඩායමක් ලෙස කරනු ලබන පරීක්ෂාවයි.

**ආදර්ශ පරීක්ෂාව** :

සියළුම සේවකයන් එක්ව යම් මනඃකල්පිත තත්ත්වයක් මත නැවත යථාතත්ත්වයට පත්වීම පිළිබඳ සාකච්ඡා කොට පරීක්ෂා කිරීම යි.

**සමාන්තර පරීක්ෂාව** :

ප්‍රධාන පරිශ්‍රයේ දී මෙන් ම ද්විතියික පරිශ්‍රයේ දී ක්‍රියාවලි කිහිපයක් ගෙන එකවිට පරීක්ෂා කිරීම.

**සම්පූර්ණ පරීක්ෂාව** :

මෙහි දී ප්‍රධාන පරිශ්‍රයෙහි සියළු ම මෙහෙයුම් නවතා දමා ද්විතියික පරිශ්‍රය තුළ ව්‍යාපාර කටයුතු අරඹයි. මෙවැනි පරීක්ෂාවක් අත්‍යාවශ්‍ය වන අතර මේ තුළින් ද්විතියික පරිශ්‍රයේ පහසුකම් පිළිබඳ විශ්වාසය තහවුරු කරගත හැක. මෙවැනි පරීක්ෂාවක් සඳහා කළමනාකාරිත්වයේ අනුමැතිය ලබාගත යුතු ය.

ඉහත ආකාරයට කරනු ලබන පරීක්ෂාවල ප්‍රතිඵල කළමනාකාරිත්වයට සන්නිවේදනය කළ යුතු අතර එම ප්‍රතිඵලවලට අනුව සැලසුම යාවත්කාලීන කළ යුතු ය.

මෙලෙස කරනු ලබන පරීක්ෂා කිරීම මගින් ආයතනය තුළ මෙම සැලැස්ම පිළිබඳ ව ඇති දැනුවත් බව ද වැඩි වේ. මීට අමතරව සැලසුම පිළිබඳ ව පුහුණු සැසි අඛණ්ඩව සිදු කළ යුතු ය.

## 07. සැලසුම නඩත්තු කිරීම

ව්‍යාපාර පරිසරය සෑම මොහොතක ම වෙනස් වේ. මෙසේ වෙනස්වන ව්‍යාපාර පරිසරයට අනුගත වන ලෙස ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක යාවත්කාලීන විය යුතු ය. එය සාර්ථක සැලැස්මක ලක්ෂණයකි. තවද, මෙසේ යාවත්කාලීන කිරීමේ වගකීම් සැලසුම තුළින් ම පවරා තිබිය යුතු ය. කෙටියෙන් කිවහොත් ව්‍යාපාරයේ සිදුවන සෑම වෙනසක්ම ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මේ නිරූපනය විය යුතු ය.

### සාර්ථක ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක ගුණාත්මක ලක්ෂණ

ඉහත සඳහන් කළ ආකාරයට ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක පරිපූර්ණ අදියර පිළිබඳ අවබෝධයක් ලබාගත හැක. ඊට අමතරව ප්‍රායෝගික ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක පහත සඳහන් ගුණාත්මක ලක්ෂණ ද තිබිය යුතු ය.

- **වගකීම් විමධ්‍යගතකරණය**

වගකීම් විමධ්‍යගතකරණය යනු වැදගත් කළමනාකරණ මෙවලමකි. ඉන් අදාළ කාර්යයේ ඵලදායීතාව ඉහළ නංවාගත හැක. ඒ අනුව ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මේ සියළුම වගකීම් වැඩි පිරිසක් වෙත විමධ්‍යගත කිරීම මගින් ආපදා අවස්ථාවක දී වැඩි ඵලදායීතාවකින් යුක්තව යථාතත්ත්වයට පත්වීමේ හැකියාව ඇත.

- **සන්නිවේදනය**

මූලික ම සන්නිවේදන ගුණාංගය නම් ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම සියළු ම දෙනා පරිශීලනය කොට තිබීම යි. ඉන් අනතුරුව පුද්ගලිකව එක් එක් පුද්ගලයාගේ කාර්යභාරය පිළිබඳ ඔවුන් වෙත පූර්ව දැනුම්දීමක් කර තිබිය යුතු ය. ආපදා අවස්ථාවක දී අන් කිසිදු දැනුම්දීමකින් තොරව පූර්ව දැනුම් දීමට/පුහුණුවට අනුව ඔවුනොවුන් තම කටයුතු අරඹනු ඇත.

එක් එක් කාර්ය සඳහා එක් පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් හෝ අනුයුක්ත කොට තිබිය හැක. අදාළ පුද්ගලයා හෝ පිරිස හෝ ආපදා තත්ත්වය හඳුනාගත් සැනින් හා ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමට අනුව ඔවුන් හට පැවරී තිබූ වගකීම් ඉටුකිරීම ආරම්භ කළ යුතු ය. ඒ අනුව විකල්ප පරිශ්‍රයේ දී දෛනික කටයුතු නැවත ආරම්භ කළ යුතු ය. එය ඉතාම ඉක්මනින් සිදුවීමට නම් මනා පූර්ව සන්නිවේදන ක්‍රියාවලියක් සකසා තිබිය යුතු ය.

- **දැනුම හා හැකියාවන්**

ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක් සම්පාදනය කිරීමේ දී හා එය ක්‍රියාත්මක කිරීමේ දී සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලට වඩා දැනුමින් හා තාක්ෂණික හැකියාවන්ගෙන් පරිපූර්ණ කණ්ඩායමක් ඊට අනුයුක්ත විය යුතු ය. එය එම සැලැස්මේ වැඩි සාර්ථකත්වයට හේතු වේ.

- **තොරතුරු සුලභ බව හා ආකර්ෂණය**

ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම පිළිබඳ වන තොරතුරු හඳුනාගත් සේවක කණ්ඩායමට ඕනෑම අවස්ථාවක ලබාගත හැකි විය යුතු ය. එසේම අත්‍යාවශ්‍ය තොරතුරු සේවකයන් නිතර පරිශීලනය කරන ආකාරයට ආකර්ෂණීයව ඉදිරිපත් කළ යුතු ය.

### සමාප්තිය

ව්‍යාපාර අඛණ්ඩතා සැලැසුමක මූලික අරමුණ; යම්කිසි ආපදා තත්ත්වයක දී දෛනික හා අත්‍යාවශ්‍ය ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කරගෙන යෑමයි. ඒ සඳහා ප්‍රශස්ත ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක අවශ්‍යතාව පැනනගී. ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක් සම්පාදනය කිරීම යනු ඉතා ක්‍රමානුකූලව සිදුවිය යුතු ක්‍රියාවලියකි. ඒ සඳහා අදියර කිහිපයක් ක්‍රමානුකූලව පසුකළ යුතු ය. සැලසුමේ ආරම්භක අදියරේ දී ව්‍යාපෘතියේ අරමුණු නිශ්චය කරගනිමින් හා වගකීම් හඳුනාගනිමින් ද අවදානම් විශ්ලේෂණ අදියරේ දී සංවිධානය තුළ ඇති සියළු ම ක්‍රියාවලි හා බද්ධව ඇති අවදානම් හඳුනාගනිමින් ද මෙම ව්‍යාපෘතිය ඇරඹේ. ඉන් අනතුරුව හඳුනාගත් අවදානම් සඳහා පූර්ව පාලන ක්‍රම ක්‍රියාත්මක කළ යුතු අතර එයින් ද ශේෂ වන අවදානම් සඳහා මීළඟ අදියර ලෙස යථාතත්ත්වයට පත්වීමේ උපාය මාර්ග හඳුනා ගත යුතු ය. සැලසුමේ සාර්ථකත්වය සඳහා ඒ පිළිබඳ පුහුණුව, දැනුවත් බව හා පරීක්ෂාව ඊළඟ අදියරේ දී අවධානයට යොමුවන කරුණු වේ. සැලසුම වඩාත් යාවත්කාලීන හා වලංගු එකක් බවට පත්කිරීම සඳහා එය හොඳින් නඩත්තු විය යුතු ය. එය ව්‍යාපාර අඛණ්ඩතා ක්‍රියාවලියේ අවසන් අදියර යි. තවදුරටත් මෙම සැලසුම වඩාත් ප්‍රායෝගික එකක් වීමට වගකීම් විමධ්‍යගත කළ යුතු අතර සැලසුමේ අඩංගු කරුණු හොඳින් සන්නිවේදනය කළ යුතු ය. අවශ්‍ය දැනුමින් හා හැකියාවන්ගෙන් සමන්විත හා සුලභව ළඟාවිය හැකි තත්ත්වයක පැවතිය යුතු ය. මෙසේ සකස් කරනු ලබන අඛණ්ඩතා සැලැස්මක් මගින් ව්‍යාපාර කටයුතු සුමටව හා අඛණ්ඩව පවත්වාගෙන යා හැක.

# 2006 අප්‍රේල්

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ පසුගිය අවුරුදුවල ප්‍රශ්න පත්‍රවලට අදාළ සවිස්තරාත්මක පිළිතුරු.

### ආර්ථික විද්‍යාව - "අ" කොටස

**සී.පී.ඒ. කරුණාතිලක,** අධ්‍යක්ෂ, බැංකු විදු පියෙස

01. එක්තරා කල්පිත ආර්ථික ක්‍රමයක මුදල් සැපයුම රුපියල් බිලියන 110 ක් බවත්, එයින් රුපියල් බිලියන 10 ක් මහජනතාව සතු ව්‍යවහාර මුදල් බවත්, ඉතිරි රුපියල් බිලියන 100 බැංකු තැන්පතු බවත් සිතන්න. මෙම ආර්ථිකයේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% කි. එබැවින් බැංකු පද්ධතිය සතුව ව්‍යවහාර මුදල් රුපියල් බිලියන 10 ක් හා රුපියල් බිලියන 90 ක ණය ප්‍රමාණයක් පවතී.

(අ) තැන්පතු ගුණකයේ අගය කොපමණද?
(ලකුණු 03 යි.)

(ආ) මහ බැංකුව සංචිත අනුපාතය 25% ක් දක්වා ඉහළ නංවන බවත්, මහජනතාව සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණයේ කිසිදු වෙනසක් සිදු නොවන බවත්, වාණිජ බැංකු අධි සංචිත පවත්වා නොගන්නා බවත් උපකල්පනය කරමින්,

I. බැංකු වත්කම් හා වගකීම්වල අලුත් අගයන් ගණනය කරන්න. (ලකුණු 04 යි.)

II. මුදල් සැපයුම ගණනය කරන්න.
(ලකුණු 02 යි.)

(ඉ) සංචිත අනුපාතය 5% දක්වා පහළ හෙළනු ලැබුවහොත් (ආ) කොටසේ ( I ) හා ( II ) ට ලැබෙන නව අගයන් ගණනය කරන්න.
(ලකුණු 06 යි.)

**පිළිතුර සඳහා සූදානම් වීම**

මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කිරීමට අපේක්ෂා කරන්නේ ආර්ථිකයක සමස්ථ මුදල් සැපයුම තීරණය වීමට පාදක වන සාධක හා එම සාධක වෙනස් වීමේදී මුදල් සැපයුමට ඇතිවන බලපෑම කුමක්ද යන්න පිළිබඳ අවබෝධයයි.

මෙම ප්‍රශ්නයට ඉතා පැහැදිලි අවබෝධයක් සහිතව පිළිතුරු සැපයීමට නම් ආර්ථිකයක සමස්ථ මුදල් සැපයුමේ අන්තර්ගත සංරචක පිළිබඳව හා එම සංරචක වෙනස් වීමට බලපාන සාධක අවබෝධ කරගත යුතුය.

මුදල් සැපයුම යනුවෙන් අදහස් කරන්නේ ආර්ථිකයේ පවතින ද්‍රවශීලතාව යි. එම ද්‍රවශීලතාව ව්‍යවහාර මුදල් සහ වාණිජ බැංකු ක්‍රමය තුළින් මවන ලද මුදල් වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. ව්‍යවහාර මුදල්, කාසි හා නෝට්ටු ස්වරූපයෙන් පවතින අතර, බැංකු මුදල් භාවිතා වන්නේ චෙක්පත් ස්වරූපයෙනි. චෙක්පතක් යනු බැංකු විසින් ගනුදෙනුකරුවන්ට භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී භාවිතා කිරීම සඳහා නිකුත්කරනු ලබන විශේෂිත උපකරණයකි. වාණිජ බැංකු විසින් ණය මැවීම සඳහා යොදා ගන්නේ මෙම උපකරණය යි. ගනුදෙනුකරුවන්ට තම ගනුදෙනු පියවා ගැනීම සඳහා ව්‍යවහාර මුදල් වෙනුවට මෙම චෙක්පත් භාවිතා කළ හැකිනම් චෙක්පත් නිකුත් කිරීමෙන් වාණිජ බැංකුවලට මුදල් සැපයුම වැඩි කිරීමට දායක විය හැකිය.

මෙසේ චෙක්පත් නිකුත් කිරීමට ඇති පදනම කුමක්ද? වාණිජ බැංකුවක් විසින් නිකුත් කරනු ලබන සෑම චෙක්පතක් පිටුපස ම ජංගම ගිණුමක ඇති තැන්පතුවක් පදනම් වේ. ජංගම ගිණුමක් යනු වාණිජ බැංකු විසින් පමණක් තම ගනුදෙනුකරුවන් වෙනුවෙන් පවත්වාගෙන යා හැකි පොලී නොගෙවන, අවශ්‍ය ඕනෑම වේලාවක පවත්නා ශේෂයට යටත්ව චෙක්පත් නිකුත් කළ හැකි ගිණුමකි.

එවැනි ජංගම ගිණුමක ඇති ශේෂය කරුණු දෙකක් මත වෙනස් විය හැකි ය. එනම්,

1. පුද්ගලයන් විසින් එම ගිණුම්වල ව්‍යවහාර මුදල් තැන්පත් කිරීම හෝ ආපසු ගැනීම.

2. වාණිජ බැංකුවක් විසින් ගනුදෙනුකරුවෙකුට ලබා දෙන ණය මුදලක් එවැනි ගිණුමකට බැර කිරීම හෝ ණය ආපසු අයකර ගැනීමේදී එය හර කිරීම.

උදාහරණයක් ලෙස වාණිජ බැංකුවක් විසින් තම ගනුදෙනුකරුවෙකුට රුපියල් 100,000 ණය මුදලක් අනුමත කොට එම මුදලට සමාන වටිනාකමකින් ගනුදෙනුකරුගේ ගිණුම බැර කොට එය ප්‍රයෝජනයට ගැනීම සඳහා

චෙක්පතක් නිකුත් කළ හොත්, ගනුදෙනුකරුට රුපියල් 100,000 දක්වා චෙක්පත් භාවිතයෙන් භාණ්ඩ හා සේවා හෝ නිෂ්පාදන සාධක සේවාවන් හෝ මිලදී ගත හැකි ය. ඒ අනුව ආර්ථිකයක පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණයේ කිසිදු වෙනසක් ඇති නොවී භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට ඇති හැකියාව හෙවත් ද්‍රවශීලතාව රුපියල් 100,000 කින් ඉහළ යයි. ඒ අනුව, වාණිජ බැංකුව සිදු කරගන්නේ රු.100,000 මුදලක් මැවීම යි. එය ජංගම ගිණුමක ඇති තැන්පතු ප්‍රමාණය වැඩිකිරීම මගින් සිදුකළ බැවින් එය තැන්පතු මැවීම ලෙස ද හඳුන්වයි. එසේම එවැනි තැන්පතුවක් මැවීමට පාදක වූයේ ණය දීම බැවින්, එය ණය මැවීම ලෙස ද හඳුන්වයි.

වාණිජ බැංකුවක් විසින් එසේ ණය මැවීමට පාදක වන්නේ කුමන සාධක ද එය වෙනස් වන්නේ කුමන තත්ත්වයන් යටතේ ද යන්න දැන් අපට සලකා බලන්න පුළුවන්.

වාණිජ බැංකුවක ව්‍යාපාරික පැවැත්මට බලපාන ප්‍රධාන සාධක දෙකකි.

1. ගනුදෙනුකරුවන්ගේ විශ්වසනීයත්වය
2. බැංකුවේ මූල්‍ය ක්‍රියාකාරිත්වය තුළින් උපයන ලාභදායිත්වය

බැංකුවක කළමනාකරණයට මුහුණ දීමට සිදුවන ප්‍රධාන අභියෝගය වන්නේ මෙම සාධක දෙක අතර මනා සමබරතාව ආරක්ෂා කර ගැනීම යි.

බැංකුවක් පිළිබඳව ගනුදෙනුකරුවන් අතර ඇති විශ්වසනීයත්වය රඳාපවතින්නේ තම මුදල් ඕනෑම අවස්ථාවක ආපසු ලබා ගැනීමට හැකිය යන විශ්වාසය මතයි. එය ආරක්ෂා කිරීම සඳහා බැංකු විසින් ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් සූදානම්ව තබාගත යුතුය. එය ද්‍රවශීලතාව පවත්වා ගැනීම ලෙස සැලකේ. ද්‍රවශීලතාව වැඩියෙන් ආරක්ෂා කිරීමට නම් වැඩි මුදල් ප්‍රමාණයක් ඒ සඳහා වෙන් කොට තැබිය යුතුය.

අනෙක් අතට බැංකුවක් ලාභ ඉපැයීමට නම් වැඩි ණය ප්‍රමාණයක් ලබා දිය යුතු ය. එපමණක් නොව වැඩි පොලියක් ලබාගත හැකි ව්‍යාපෘතිවලට ණය ලබාදිය යුතු ය. වැඩියෙන් ණය දීමෙන් ද්‍රවශීලතාව අඩුවේ. වැඩියෙන් ද්‍රවශීලතාව රැකීමෙන් ණය සැපයීමට අපහසු වේ. ඒ අනුව ද්‍රවශීලතාව හා ලාභදායිත්වය යනු එකිනෙකට පරස්පරව ක්‍රියාත්මක වන විචල්‍යයන් දෙකකි.

වැඩි ලාභයක් උපයාගැනීමට හැකියාවක් ඇති අවස්ථාවලදී බැංකු නිරායාසයෙන්ම ඒ සඳහා පෙළඹීමට ඉඩ ඇති අතර, එවැනි අවස්ථාවක ද්‍රවශීලතාව ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ එතරම් සැලකිල්ලක් නොදැක්වීමෙන් අවදානම් සහගත තත්ත්වයක් ඇතිවිය හැකි ය. මේ නිසා මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවයට යම් අහිතකර බලපෑමක් ද අතිවිය හැකිය. මේ ආකාරයට බැංකුවල ස්වයං මූල්‍ය කළමනාකරණයක් ඇතිවීම සහතික කළ නොහැකි නිසා, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව ආරක්ෂා කිරීමේ වගකීම පැවරී ඇති අධිකාරිමය බලයක් ඇති මහ බැංකුව විසින් වාණිජ බැංකුවල තැන්පතුවලට සමගාමීව එම තැන්පතුවල ප්‍රතිශතයක් ලෙස සංචිත මුදල් ප්‍රමාණයක් මහ බැංකුව සතුව පවත්වා ගැනීම අනිවාර්ය කර තිබේ. මෙවැනි බලපෑමක් කිරීමට ඇති බලය පනතක් මගින් ලබා දී ඇති බැවින් එය ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ලෙස සලකයි. මෙම ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වාණිජ බැංකුවල ණය මැවීමට බලපාන ආකාරය දැන් සලකා බලමු.

උදාහරණයක් ලෙස ගනුදෙනුකරුවෙක් රුපියල් 100 මුදලක් තම ජංගම ගිණුමෙහි තැන්පත් කළේ යැයි සිතමු. එසේම මහ බැංකුව විසින් පනවා ඇති සංචිත අනුපාතය 10% යයිද උපකල්පනය කරමු. ඒ අනුව වාණිජ බැංකුවක පහත සඳහන් ක්‍රියාකාරිත්වය අපට හඳුනා ගන්න පුළුවන්.

**සංඛ්‍යා සටහන - 1**

| වටය | තැන්පතු (රු.) | සංචිත (රු.) | ණය (රු.) |
|---|---|---|---|
| 1 | 100 | 10 | 90 |
| 2 | 90 | 9 | 81 |
| 3 | 81 | 8.1 | 72.9 |
| ... | ... | ... | ... |
| ... | ... | ... | ... |
| ... | ... | ... | ... |
| අවසාන | 0 | 0 | 0 |
| සියලුම වටවල එකතුව | 1000 | 100 | 900 |

ඉහත සංඛ්‍යා සටහනට අනුව එක් එක් වටයේ දී සිදුවන වෙනස්කම් පිළිබඳව අවධානය යොමු කරමු. රුපියල් 100 තැන්පතුවක් ලැබෙන පළමු වටයේදී රු.100 ක තැන්පතුවක් බැංකුවේ ශේෂ පත්‍රයේ වගකීම් අංශයෙහි සටහන් වේ. තැන්පතුව ලැබීමත් සමග වාණිජ බැංකුවට පැවරෙන ව්‍යවස්ථාපිත වගකීම වන්නේ තැන්පතුවෙහි වටිනාකමෙන් 10% වන රු.10 මහ බැංකුවේ තැන්පත් කිරීමයි. එම ව්‍යවස්ථාපිත අවශ්‍යතාව සම්පූර්ණ කිරීමෙන් පසු ඉතිරි රු.90 (100 - 10) ණය දීම සඳහා භාවිතා කළ හැකිය. ඒ අනුව පළමු වටයේ දී ම රුපියල් 90 ණයක් අනුමත කොට එම ප්‍රමාණය තෙක් චෙක්පත් ලිවීමේ හැකියාව ගනුදෙනුකරුවන්ට ලබා දිය හැකිය. මහ බැංකුවේ තැන්පත් කරනු ලබන සංචිත මුදලත්, ගනුදෙනු කරුවන්ට ලබාදෙන ණයත් වාණිජ බැංකුවේ වත්කම් වේ. ඒ අනුව වාණිජ බැංකුවේ ශේෂපත්‍රය පහත සඳහන් පරිදි සටහන් කළහැකි ය.

සංඛ්‍යා සටහන - 2

| වත්කම් | | වගකීම් | |
|---|---|---|---|
| සංචිත | 10 | තැන්පතු | 100 |
| ණය | 90 | | |
| | 100 | | 100 |

එසේ දෙන ලද රු. 90 ක ණය මුදල පදනම් කරගෙන ගනුදෙනුකරු විසින් භාවිතා කරන චෙක්පත නැවත බැංකු පද්ධතිය තුළ තැන්පත් කිරීමෙන් දෙවන වටයේදී රු.90 තැන්පතුවක් නිර්මාණය වේ. මේ නව තැන්පතුව සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ලෙස රු. 9 ක (රු.90 ක් 10%) මුදලක් මහ බැංකුවේ තැන්පත් කිරීමෙන් අනතුරුව ඉතිරි රු. 81 මුදල ණය මැවීම සඳහා පදනම් කරගත හැකිය. මේ ආකාරයට සෑම වටයක් පාසා ම ණය මුදලක් සහ ඊට සමාන තැන්පතුවක් වාණිජ බැංකු ක්‍රමය තුළ මැවෙන අතර සෑම තැන්පතුවක් සඳහා ම එහි වටිනාකමින් 10% ක් මහ බැංකුවේ තැන්පත් කළ යුතු ය. මෙම ක්‍රියාවලිය අවසන් වන්නේ ආරම්භක වශයෙන් තැන්පතුවක් ලෙස වාණිජ බැංකුවට ලැබුණු ව්‍යවහාර මුදල් රුපියල් 100 ම ක්‍රමයෙන් මහ බැංකුවේ පවත්වාගෙන යන සංචිත ලෙස තැන්පත් වීමෙන් අනතුරුව යි.

සංඛ්‍යා සටහන් - 1 ට අනුව, ඒ ඒ වටයේ දී සටහන් වූ තැන්පතු අගය, සංචිත අගය සහ දෙන ලද ණය ප්‍රමාණය ද එකතු කළ පසු තැන්පතුවල මුලු අගය රු.1000 ක් ලෙස ද සංචිතවල මුලු අගය රු. 100 ක් ලෙස ද, මුලු ණයවල වටිනාකම රු. 900 ක් ලෙස ද සටහන් වී ඇත.

මේ සියලු අවස්ථාවන්ගෙන් පසු වාණිජ බැංකු පද්ධතියේ ශේෂපත්‍රය පහත සඳහන් පරිදි වේ.

සංඛ්‍යා සටහන - 3

| වත්කම් | | වගකීම් | |
|---|---|---|---|
| සංචිත | 100 | තැන්පතු | 1000 |
| ණය | 900 | | |
| | 1000 | | 1000 |

ආරම්භක වටයේ සහ සියලු වටවල එකතුවලට අනුව තැන්පතු ප්‍රමාණය රු. 900 කින් (1000 -100) වැඩි වී ඇති බව පෙනී යයි. මෙම වැඩිවීම වෙනුවෙන් අලුතෙන් ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය තුළ තැන්පත් කිරීමක් සිදු වී නොමැත. එසේ නම් එම රු.900 ම බැංකු ක්‍රමය විසින් ණය දීම තුළින් මවන ලද තැන්පතු වේ. මෙම වැඩිවීම් කුමන ප්‍රමාණයකින් සිදු වී ඇත්දැයි දැන් සලකා බලමු.

දැන් වාණිජ බැංකු පද්ධතිය තුළ ආරම්භක වටයේ පැවති ශේෂපත්‍රය සහ වට සියල්ලම අවසානයේ ඇති ශේෂපත්‍රය සංසන්දනය කර බලමු.

| අයිතමය | ආරම්භක වටය | වට සියල්ල අවසානයේ | වැඩිවීම |
|---|---|---|---|
| වගකීම් | 100 | 1000 | 10 ගුණයක් |
| තැන්පතු | 100 | 1000 | 10 ගුණයක් |
| වත්කම් | 100 | 1000 | 10 ගුණයක් |
| සංචිත | 10 | 100 | 10 ගුණයක් |
| ණය | 90 | 900 | 10 ගුණයක් |

ඒ අනුව සෑම අයිතමයක්ම 10 ගුණයකින් වැඩි වී ඇති බව පෙනී යයි. තැන්පතු සහ ණය 10 ගුණයකින් වැඩි වී ඇති බව පෙනී යයි. ඒ නිසා එම වැඩිවීමේ අගය තැන්පතු ගුණකය සහ ණය ගුණකය ලෙස ද හඳුන්වනු ලබයි.

වැදගත්

වාණිජ බැංකු මුදල් මැවීම උපරිමය දක්වා සිදුවීමට නම් කොන්දේසි 3 ක් සම්පූර්ණ විය යුතු ය.

1. සියලු ගනුදෙනු චෙක්පත් භාවිතයෙන් පමණක් සිදුවිය යුතු ය.
2. ගනුදෙනුකරුවන් තමන් ළඟ තබා ගන්නා මුදල් ප්‍රමාණය මුලින් පැවති තත්ත්වයේ ම තබාගත යුතු ය.
3. වාණිජ බැංකු අධි සංචිත පවත්වා නොගත යුතු යි.

දැන් අපි මෙම ගුණකයේ අගය 10 වූයේ කෙසේදැයි පරීක්ෂා කර බලමු. මෙම අගය ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ ප්‍රතිලෝමය වේ.

මෙතෙක් කළ සාකච්ඡාවෙන් අනතුරුව අපට ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම එතරම් අපහසු නොවනු ඇත.

ඒ සඳහා දී ඇති තොරතුරු හඳුනා ගනිමු. එය පහත සඳහන් අයුරින් වෙන් කොට හඳුනා ගත හැකිය.

| | | | |
|---|---|---|---|
| මුලු මුදල් සැපයුම | = | රු. බිලියන | 110 |
| මහජනයා වෙතැති මුදල් | = | රු. බිලියන | 10 |
| බැංකු තැන්පතු | = | රු. බිලියන | 100 |
| බැංකු සතු ව්‍යවහාර මුදල් | = | රු. බිලියන | 10 |
| ණය ප්‍රමාණය | = | රු. බිලියන | 90 |

ඒ අනුව බැංකුවේ ශේෂ පත්‍රය පහත සඳහන් පරිදිවේ

| වත්කම් (රු.බිලියන) | | වගකීම් (රු.බිලියන) | |
|---|---|---|---|
| සංචිත | 10 | තැන්පතු | 100 |
| ණය | 90 | | |
| | 100 | | 100 |

ඒ අනුව මුලු මුදල් සැපයුම = මහජනයා සතු ව්‍යවහාර මුදල් + බැංකු තැන්පතු

= 10 + 100 = 110

(අ) තැන්පතු ගුණකයේ අගයත් ණය ගුණකයේ අගයත් දෙක ම ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ ප්‍රතිලෝමයට සමාන වියයුතුය.

තැන්පතු ගුණකය = $\frac{1}{10\%}$ = $\frac{1}{0.1}$ = 10

(ආ) මෙහිදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 25% ක් වී ඇති අතර බැංකු පද්ධතිය තුළ ඇති ව්‍යවහාර මුදල් ප්‍රමාණය කිසිදු වෙනසක් සිදු වී නැත. එසේම බැංකු අධි සංචිත පවත්වා නොගන්නා බැවින් පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය වන රුපියල් බිලියන 10 තැන්පතුවල 25% කට සමාන විය යුතු අතර එය ව්‍යවස්ථාපිත සංචිත ලෙස මහ බැංකුව තුළ පැවතිය යුතුය. ඒ අනුව මුලු තැන්පතු ප්‍රමාණය පහත සඳහන් අයුරින් සොයාගත හැකිය.

රු. බිලියන 10 = 0.25 මුලු තැන්පතු

∴ මුලු තැන්පතු = $\frac{10}{0.25}$ = රුපියල් බිලියන 40

බැංකුවේ ආරම්භක තැන්පතුව රු. බිලියන 10 ව්‍යවහාර මුදල් ප්‍රමාණයට සමාන බැවින් මුලු තැන්පතු සහ එම ප්‍රමාණය අතර වෙනස වන රු. බිලියන 30 (40 - 10) බැංකු පද්ධතිය මගින් ණය දීම මගින් මවන ලද තැන්පතු විය යුතුය. ඒ අනුව ශේෂපත්‍රය පහත සඳහන් පරිදි පෙන්විය හැකිය.

(i)

| වත්කම් (රු.බිලියන) | | වගකීම් (රු.බිලියන) | |
|---|---|---|---|
| සංචිත | 10 | තැන්පතු | 40 |
| ණය | 30 | | |
| | 40 | | 40 |

(ii) මුදල් සැපයුම = මහජනයා වෙතැති මුදල් + බැංකු තැන්පතු ශේෂය

= බිලියන 10 + බිලියන 40 = බිලියන 50

(ඉ) සංචිත අනුපාතය පහළ දැමුවහොත් ඇතිවන තත්ත්වය ඉහත (ආ) කොටසට පිළිතුරු සැපයූ ආකාරයෙන් ම සොයාගත හැකි ය. මෙහිදී සංචිත අනුපාතය 5% වී ඇති අතර වාණිජ බැංකුව සහ ව්‍යවහාර මුදල් ප්‍රමාණය වෙනස් නොවී රුපියල් බිලියන 10 පවතී.

| වත්කම් (රු.බිලියන) | | වගකීම් (රු.බිලියන) | |
|---|---|---|---|
| සංචිත | 10 | තැන්පතු | 200 |
| ණය | 190 | | |
| | 200 | | 200 |

(i) රු. බිලියන 10 = 0.05 x තැන්පතු (0.05 =5%)

තැන්පතු = $\frac{10}{0.05}$ = $\frac{1000}{5}$ = 200 (රුපියල් බිලියන)

මවන ලද තැන්පතු = 200 - 10 = 190 (රුපියල් බිලියන)

ඒ අනුව ශේෂ පත්‍රය

(ii) මුදල් සැපයුම = මහජනයා වෙතැති මුදල් + තැන්පතු

= 10 + 200 = 210 (රුපියල් බිලියන)

**Econ Icon SEASON II**

**Econ Icon Season II තරඟය සඳහා සුදුසු කණ්ඩායම් තෝරා ගැනීමේ මූලික තරඟ විභාගයේ සහ රූපවාහිනී තරඟ මාලාවේ ප්‍රශ්න සහ පිළිතුරු ඉදිරි සටහන කලාපවල පළවේ.**

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.